# බුදු දහමේ ලෞකිකකරණය: කොළඹ නගරයේ මහාමාර්ග ආශ්‍රිතව පිහිටුවා ඇති බෞද්ධ සිද්ධස්ථාන වන්දනාමාන කිරීම පිළිබඳ මානවවංශලේඛික අධ්‍යයනයක්

ඇන්ටන් පියරත්න

## හැඳින්වීම

සාමාන්‍යයෙන් ශ්‍රී ලංකාව තුළ ගමන් කරන ඕනෑම අයෙකුට ප්‍රධාන මාර්ගයන්හි, හන්දි ආශ්‍රිතව" දුම්රිය ස්ථාන අසල, උද්‍යාන, රෝහල්, පාසල්, රජයේ කාර්යයාල සහ වෙනත් විවිධ පොදු ස්ථානවල කුඩා බෞද්ධ, කතෝලික සහ හින්දු සිද්ධස්ථාන සංඛ්‍යාව වැඩි වීම නිසැකවම නිරීක්ෂණය කරනු ඇත. කොළඹ නගරයද මෙම විවිධ ආගමික විශ්වාසවලට අනුබද්ධ කුඩා සිද්ධස්ථාන ඉදිකිරීමේ ප්‍රවණතාවයට ව්‍යතිරේකයක් නොවේ. මෙම කුඩා සිද්ධස්ථාන බුදුරජාණන් වහන්සේගේ, හින්දු දෙවිවරුන්ගේ හෝ කතෝලික සාන්තුවරයන්ගේ පිළිම වලින් සමන්විත වේ. 2009 වසරේ මෙම කුඩා පූජනීය ස්ථානයන් නිරීක්ෂණය කිරීමේදී කතුවරයාගේ සිතට නැගුණු ප්‍රශ්න කිහිපයක් නම්: මෙම සිද්ධස්ථාන හුදකලාව පවතින්නේ ද? මිනිසුන් මෙසේ මාර්ගය අසල සිද්ධස්ථාන ඉදිකිරීමට පෙළඹෙන්නේ කුමක් නිසාවෙන් ද? ඒවා එසේ පවතින්නේ ඇයි? මිනිසුන් හට මෙම සිද්ධස්ථාන වලින් ලැබෙන ප්‍රයෝජනයන් මොනවාද? මෙම සිද්ධස්ථාන සංවර්ධනය පිටුපස සිටිනා මිනිසුන් කවුරුන්ද? කොහොමද මෙම සිද්ධස්ථාන දියුණු වෙන්නේ? යන්නයි. මෙම ප්‍රශ්නයන් නගරවාසීන්ගේ ආගමික හැසිරීම් සහ සමාජ සංස්කෘතික හා ආර්ථික තත්ත්වයන් අවබෝධ කර ගැනීම සඳහා ඉතා ප්‍රයෝජනවත් විය. මෙම පසුබිම පාදක කර ගනිමින් කතුවරයා විසින් වත්මන් පර්යේෂණය සිදු කරනු ලැබුවේ නගර වැසියන් කොළඹ මාර්ගය අසල සිද්ධස්ථාන ඉදිකර වන්දනාමාන කිරීමට හේතුව සහ එය සිදුවන්නේ කෙසේද යන්න පැහැදිලි කිරීමට සහ නැගී එන විකල්ප ආගමික පිළිවෙත් හඳුනා ගැනීම අරමුණු කර ගෙනය. මේ අශ්‍රිත මානවවංශලේඛික දත්ත (ethnographic data) එකතු කිරීම 2009 වර්ෂයේදී සහ එයට හරියටම වසර 10 කට පසුව 2019 වර්ෂයේදී ද සිදු විය. ප්‍රථමයෙන්ම

කුඩා ප්‍රශ්නාවලියකට ප්‍රතිචාර දැක්වූවන් පාදක කොටගෙන මූලික සමාජ-ආර්ථික දත්ත එකතු කරන ලදී. ඉන් අනතුරුව, පුද පූජා රටාවේ ස්වභාවය සහ මාර්ගය අසල සිද්ධස්ථාන වැඳ පුදා ගැනීමට හේතුසාධකයන් පිළිබඳව වැඩිදුර තොරතුරු ලබා ගැනීම සඳහා පුද්ගලයන් සමග තනි තනිව සහ කණ්ඩායම් වශයෙන් සම්මුඛ සාකච්ඡා පවත්වන ලදී. මීට අමතරව, පර්යේෂක කණ්ඩායම ක්‍රියාවලියන් පිළිබඳව සහභාගීත්ව විශ්ලේෂණයක් ලබා ගැනීම උදෙසා අදාළ කමිටු විසින් සංවිධානය කරන ලද විවිධ ප්‍රජා ක්‍රියාකාරකම් සහ ආගමික ක්‍රියාකාරකම් සඳහා සහභාගී විය. තවද, පර්යේශණ කණ්ඩායම් සාමාජිකයන් විවිධ පාර්ශවයන් මෙම වන්දනාමානයන්හි නියැලෙන ආකාරය නිරීක්ෂණය කිරීම තුළින් විවිධ වන්දනාමාන රටාවන්, බැතිමතුන්ගේ ස්වභාවයන් ආදී කරුණු නිරීක්ෂණය කරන ලදි. සවිස්තරාත්මක සම්මුඛ සාකච්ඡා සහ වෘත්තාන්තයන් විශ්ලේෂණය කරන ලද අතර එමගින් මෙම කුඩා සිද්ධස්ථාන ආශ්‍රිතව බැතිමතුන්ගේ ආගමික හැසිරීම් තුළ පවත්නා පොදු තේමාවන් එකතු කර ගැනීමට හැකි විය. බොහෝ විට එකම සිද්ධස්ථානය පර්යේෂණ අවස්ථා දෙකේදීම නිරීක්ෂණය කරන ලදී.

මෙම පර්යේෂණ පත්‍රය කොළඹ නගරයේ නාගරික වැසියන් මාර්ගය අසල ආගමික සිද්ධස්ථාන ඉදිකිරීම සහ ඒවාට වන්දනාමාන කිරීමේ අරමුණු සහ ක්‍රමවේදයන් හඳුනා ගැනීමටත්, විකල්ප නව ආගමික පිළිවෙත් හඳුනාගැනීම පිළිබඳවත් අවධානය යොමු කරයි. මෙම පර්යේෂණ පත්‍රය ආරම්භ වන්නේ කොළඹ නගරයේ බහු සංස්කෘතික ස්වභාවය පිළිබඳ කෙටි හැඳින්වීමකින් ය. ඕනෑම අයෙකු හට නාගරික ආගමික සම්ප්‍රදායන් ග්‍රහණය කර ගැනීමට පහසු වීම සඳහා කුඩා සිද්ධස්ථාන පිළිබඳ විස්තරයක් මීළඟ කොටසෙන් විස්තර කරන අතර ඊට පසු සිද්ධස්ථානයන් හි සංවර්ධනය සහ පැතිරීම ක්‍රියාවලියේදී බෝ ගසෙහි කාර්යභාරය පිළිබඳ විවේචනාත්මක සාකච්ඡාවක් හා සම්බන්ධ වේ. ඉන් පසු, මෙම පර්යේෂණ පත්‍රය නගරය, ආගම සහ නගරයෙහි මිනිස් ගැටළු හා සම්බන්ධ වූ න්‍යායාත්මක පසුබිම පිළිබඳව අවධානය යොමු කරයි. අවසාන වශයෙන් මෙම පර්යේෂණ පත්‍රය මිනිසුන් ආගමික සිද්ධස්ථාන ඉදිකර ඒවාට වන්දනාමාන කිරීමට හේතුව සහ එය

සිදුවන්නේ කෙසේද යන්න කෘත්‍යවාදී දෘෂ්ටිකෝණයකින් න්‍යායාත්මකව පැහැදිලි කිරීමට උත්සහ දරයි.

## කොළඹ නගරයේ බහු සංස්කෘතික ස්වභාවය

කොළොම්ඹො (Colombo) ලෙස ඉංග්‍රීසි බසින් හා කොළුම්බූ (கொழும்பு) ලෙස දෙමළ බසින් හඳුන්වනු ලබන කොළඹ නගරය දිගුකාලීන යටත්විජිත උරුමකමකට හිමිකම් කියන අතර විවිධ වාර්ගික, ආගමික, සංස්කෘතික හා සමාජ කණ්ඩායම් වලින් යුක්ත මිලියනයකට ආසන්න ජන කොට්ටාශයකගේ නිවහන වේ. කොළඹ මහ නගර සභාව (කො.න.ස.) වර්ග කිලෝමීටර් 37.5 ක ප්‍රදේශයක පැතිරී ඇති අතර තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය යටතේ පවත්නා ග්‍රාම නිලධාරී වසම් 35 කින් හා කොළඹ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය යටතේ පවත්නා ග්‍රාම නිලධාරී වසම් 20 කින් සමන්විත වන අතර 2012 ජන හා නිවාස සංගණන අවසන් වාර්තාවට අනුව විවිධ ජනවාර්ගික පසුබිම් නියෝජනය කරන පුද්ගලයින් 561,314 කින් සමන්විත වේ. ඊට අමතරව කොළඹ නගරයට දෛනිකව රැකියාව සඳහා විවිධ ජනවාර්ගික ආගමික පසුබිම් වලින් යුක්ත පුද්ගලයින් 500,000 ට ආසන්න ප්‍රමාණයක් පැමිනේ . කොළඹ නගරය බහු ආගමික ජන කොට්ටාශයකට වාසස්ථානය වේ. 2012 වසරේ කරන ලද සංගණනයකට අනුව, 1,632,225 (70.2%) බෞද්ධයන්, 186,454 (8.0%) හින්දු, 274,087 (11.8%) මුස්ලිම්වරු, 162,314 (7.0%) රෝමානු කතෝලිකයන්, 66,994 (2.9%) කිතුනුවන් සහ 2,275 (0.1%) අනෙකුත් ආගමික අනුගාමිකයන් කොළඹ දිස්ත්‍රික්කය තුළ ජීවත් වේ. කොළඹ මහ නගර සභා නිළ වෙබ් අඩවියෙහි වාර්තා කර ඇති පරිදි නේවාසික දේපල 106,068ක් සමගින් ද, වාණිජ දේපල 35,604 ක් සහ රජයේ දේපළ 155,501 ක මුළු දේපළකින් යුක්තව රු. බිලියන 16.9ක වාර්ෂික අයවැයකින් යුක්ත වේ. කොළඹ නගරවාසීන් ප්‍රධාන වශයෙන් දෙමළ සහ සිංහල එදිනෙදා සන්නිවේදනයන්හීදී භාවිත කරන අතර ඉංග්‍රීසි ද මෙරට නිල භාෂාවකි. ශ්‍රී ලාංකිකයන් සෑම විටම එක ආගමකට සීමා වන්නේ නැති අතර බොහෝ දුරට ආගමික සමමුහුර්තකරණයේ (religious syncretism) යෙදෙන්නන් වේ. ඔවුන් අන්‍යාගමික සිද්ධස්ථාන වෙත ගොස් තමන්ගේ අවශ්‍යතා සහ තත්ත්වයන්ට

අනුකූලව වන්දනාමාන කර එම ආගම්වලට ආවේණික අධ්‍යාත්මික බලවේගයන්ගෙන් උපකාරයන් ලබා ගැනීමට නැඹුරුවක් පෙන්වයි. උදාහරණ වශයෙන්, බහුතරයක් බෞද්ධයන් හින්දු කෝවිල් වන්දනාමාන කර එම හින්දු දේවස්ථානයන්හි දෙවි දේවතාවුන්ගේ ආශිර්වාදය අපේක්ෂා කරයි. 2019 පාස්කු ඉරිදා ඉස්ලාමීය ත්‍රස්තවාදී කණ්ඩායම විසින් දියත් කරන ලද හොඳින් සම්බන්ධීකරණ මරාගෙන මැරෙන ප්‍රහාරයක ඉලක්කයක් වූ පල්ලි තුනෙන් එකක් වූ කොළඹ කොච්චිකඩේ පිහිටි ශාන්ත අන්තෝනි දේවස්ථනය සමෘද්ධිය සහ යහපැවැත්ම සාක්ෂාත් කර ගැනීම උදෙසා බැතිමතුන්ගේ ආශාවන් ඉෂ්ට කිරීමට ප්‍රසිද්ධවීම හේතුවෙන් බෞද්ධ, මුස්ලිම්, හින්දු සහ අනෙකුත් බැතිමතුන්ගේ වන්දනමානයන්ට ලක්වූ සිද්ධස්ථානයකි. 2001 සහ 2012 සංගණන දත්ත සංසන්දනය කිරීමේදී කොළඹ, ශ්‍රී ලංකාවේ අගනුවර, බෞද්ධ නොවන ආගමික කණ්ඩායම්වල වර්ධනයක් ද නිරීක්ෂණය කළ හැකිය. කොළඹ නගරය ජනගහනය අධිකම නගරය බවට පත් වීමට බලපෑ හේතු රාශියක් ඇත. ඒවා අතුරින් වඩාත් වැදගත්කමක් දීමට හැකි වන්නේ දශක තුනක් පමණ කාලයක් තිබූ යුද්ධය, ග්‍රාමීය ප්‍රදේශ හා වතුකර ක්ෂේත්‍රය (estate sector) අතර පවතින ආර්ථික පීඩනය, අධ්‍යාපනය සහ අනෙකුත් සමාන ප්‍රදේශයන් හා සසඳන විට කොළඹ නගරයේ පවතින ආර්ථික සංවර්ධනය යන හේතු දැක්විය හැක. මෙම ජනවාර්ගික වෙනස "අප අනුගමනය කරන්නේ ආගමික බහුත්වවාදය ද (religious pluralism) නැතහොත් එය වෙනත් යමක් ද?" යන ප්‍රශ්නය ඇති කරයි.

## කුඩා බෞද්ධ සිද්ධස්ථානවල නෛසර්ගික ලක්ෂණයන්

මෙම සිද්ධස්ථාන කුඩා සිද්ධස්ථාන ලෙස හැඳින්වූව ද, ඒවාටම ආවේණික වූ විශාලත්වයන්ගෙන් යුක්ත වේ. සමහර සිද්ධස්ථානයන් ප්‍රමාණයෙන් ඉතා කුඩා වේ; අඩි 3-6 ක උස ප්‍රමාණයකින් යුක්ත කොන්ක්‍රීට් කනුවක් මත අඩි 2.5X2.5 වීදුරු පෙට්ටියක් තුළ තබා ඇති කුඩා බුදු පිළිමයක් විය හැක. පිටකොටුව (කොළඹ කොටුව), පුංචි බොරැල්ල, නාරාහේන්පිට සහ බොරැල්ල හංදිය යන ස්ථානයන්හි පිහිටි සිද්ධස්ථානයන් විශාලතම

සිද්ධස්ථානයන් සඳහා උදාහරණ ලෙස හැඳින්විය හැක. තවද, මෙම සිද්ධස්ථාන බොහොමයක් නගර සභාවේ, මාර්ග සංවර්ධන අධිකාරියේ හෝ අදාළ රාජ්‍ය බලධාරීන්ගේ අවසරයකින් තොරව බොහෝ විට රාත්‍රියක් හෝ රාත්‍රී කිහිපයක් ඇතුළත ඉතා කෙටි කාලයක් තුළ ඉදිකර තිබීම සාමාන්‍ය සංසිද්ධියකි. මෙම ක්‍රියාකලාපය පසුපස පවතින තර්කය නම් ඉදිකිරීම් සම්පූර්ණ කළ පසු එය මාර්ග සංවර්ධන අධිකාරිය, නාගරික සංවර්ධන අධිකාරිය හෝ වෙනත් කිසිදු පරිපාලන ආයතනයකට ඉවත් කිරීමට නොහැකි වූයේ එය සමාජය විසින් පව්කාර ක්‍රියාවක් ලෙස හෙලා දකින බැවිනි. එපමණක් නොව, නීත්‍යානුකූලභාවය පවතින අවස්ථාවන්හිදී වුවද ඒවා ඉවත් කිරීමට තැත් කිරීම මහජන උද්ඝෝෂණයන්ට තුඩු දිය හැකිය. මෙය චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග ජනාධිපතිනියගේ පාලන සමයේදී පුංචි බොරැල්ලේ පිහිටි සිද්ධස්ථානය ඉවත් කිරීමට රජය විසින් දරන ලද උත්සාහයෙන් මනාව පැහැදිලි වේ. මෙම පර්යේෂණය සිද්ධස්ථාන 16ක් නියැදිය වශයෙන් තෝරාගත් අතර එයින් 10ක් පමණ 2001 වර්ෂයෙන් අනතුරුව ඉදිකරන ලදි. ඉන් එකක් ප්‍රසිද්ධ රජයේ පාසලක් ඉදිරිපස ඉදිකර ඇති අතර අනෙක් තුන 1980 සහ 1983 වර්ෂයන් අතර ඉදි කරන ලදි. මේවා අතුරින් පිටකොටුව, පුංචි බොරැල්ල සහ නාරාහේන්පිට සිද්ධස්ථානයන් දීර්ඝ ඉතිහාසයක් සහිත පැරණිම සිද්ධස්ථානයන් වේ. පිටකොටුවේ පිහිටි සිද්ධස්ථානයෙහි 1958 වර්ශයේ සිට සාර්ථක ලෙස දන්සැල් පැවත්වීම ආරම්භ කර ඇති අතර එහි දිගු ඉතිහාසය එමගින් පිළිඹිබු වේ. මෙම කාලය තුළ සිද්ධස්ථාන ඉදිකිරීමෙහි වර්ධනය සහ එකල හටගත් සමාජ ආර්ථික වෙනස්කම් පිළිබඳව සලකා බලන විට ඒවා එකිනෙකට යම් ආකාරයක සබඳතාවන් ඇති බව දක්නට ලැබේ. බර්ක්විට්ස් (2003,70); සඳහන් කරන ආකාරයට මෙම සිද්ධස්ථාන එකිනෙකට වෙනස් වූ නව ගෘහ නිර්මාණ ශිල්පයන්, ආලෝක හා ශබ්ද පද්ධති වැනි නව තාක්ෂණය උපයෝගී කර ඇති බවට සාක්ෂි දරයි. ආගමික පිළිවෙත් හැඩගස්වීම සඳහා නව තාක්ෂණයෙහි බලපෑම වඩා පුළුල් අර්ථයකින් මෙමගින් පෙන්වයි.

මෙම සිද්ධස්ථාන සංවර්ධනය කිරීම ක්‍රියාවලියක් ලෙස සැලකිය හැකිය. විවිධ හේතූන් මත විවිධ යුගයන්හි (different epochs) විවිධ පුද්ගලයින්

විසින් ඒවා ස්ථාපිත කර ඇත. පැරණි සිද්ධස්ථානයන් සහ අලුත් සිද්ධස්ථානයන් සන්දර්භයන් (context) දෙකක සංවර්ධනය කරන ලද අතර නව සිද්ධස්ථානයන් ත්‍රී රෝද රථ සංගම් හි සමාජ සේවයන් ලෙස ඉදිකරන ලදි. ත්‍රිරෝද රථ රියදුරන් තම වාහන නැවැත්වීමේ ස්ථාන ("පාක් එක") කොළඹ නගරයේ ප්‍රධාන මාර්ගය දෙපස මෙන්ම දුර බැහැර ප්‍රදේශවල සෑම හන්දියක්ම පාහේ ස්ථාපිත කර තිබීම සාමාන්‍ය සංසිද්ධියකි. එක් අතකට ත්‍රිරෝද රථ නැවැත්වීමේ ස්ථානයන්ට ආසන්නව කුඩා සිද්ධස්ථාන ඉදිකිරීම හෝ ත්‍රිරෝද රථ රියදුරන් සිද්ධස්ථාන පිහිටුවීම සඳහා අනුග්‍රහය දැක්වීම තම ව්‍යාපාරික අවකාශය සුරක්ෂිත කර ගැනීමේ සාමකාමී ප්‍රයත්නයක් සහ පොදු ස්ථානවල තම පැවැත්ම සාධාරණීකරණය කර ගැනීමේ මාර්ගයක් ලෙස අර්ථ දැක්විය හැකිය. මෙම ඉදිකිරීම් ඔවුන්ගේ සමාජ හා ප්‍රජා ක්‍රියාකාරකම්වල (civic engagement) කොටසක් සලකනු ලබයි. බහුතරයක් පූජනීය ස්ථානයන් සාමූහික ප්‍රයත්නයක් ලෙස ගොඩනගා ඇත්තේ බොහෝ දෙනෙකුගේ උදව් උපකාරයන් සහිතවය.

බොහෝ බෞද්ධ සිද්ධස්ථාන ඉදිකිරීමට දායකත්වය සපයා ඇත්තේ කොළඹ නගරයේ අලුතින් දියුණු වූ මධ්‍යම පංතිය විසිනි. මෙම සිද්ධස්ථානයන්හී සංවර්ධනය පිළිබඳ හැදෑරීම කොළඹ නගරයේ සමාජ විකාශනය හා වෙනස්වීම විග්‍රහ කිරීමට ප්‍රයෝජනවත් වනු ඇත. නාරාහේන්පිට, බොරැල්ල, පුංචි බොරැල්ල සහ රාජගිරිය ප්‍රදේශයන්හී පවතින සිද්ධස්ථානයන් මෙරට බෞද්ධ පුනර්ජීවන ව්‍යාපාරය හා සම්බන්ධ කළ හැක. මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි විසින් මෙහෙයවන ලද බෞද්ධ පුනර්ජීවන ව්‍යාපාරයේ කොටසක් ලෙස ශ්‍රී ලංකාවේ ක්‍රිස්තියානි ආගම ප්‍රවර්ධනය කිරීමට උත්සාහ කළ පුද්ගලයන්ගේ (imperialists) සහයෝගයට එරෙහිව කොළඹ නගරය තුළ බෝ පැල සිටවන ලදි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, මෙම ස්ථානවල විවිධ පුද්ගලයන් විසින් පූජකවරුන්ගේ සහ දේශපාලනඥයන්ගේ සහය ඇතිව සිද්ධස්ථාන සංවර්ධනය කර ඇත. නැගී එන මධ්‍යම පාංතිකයන්ගේ ද සහයෝගය ඇතිව පැරණි සිද්ධස්ථාන ද වැඩිදියුණු කිරීම සිදුවිය.

මැතකදී සංවර්ධනය කරන ලද සිද්ධස්ථානවලට ත්‍රිරෝද රථ සේවා සපයන්නන් වැනි නගරයේ සුළු ධනේශ්වර (petty bourgeoisie) පන්තියේ වැඩි සහයෝගයක් ලැබී ඇත. එමෙන්ම මෙම සිද්ධස්ථාන සංවර්ධනය සඳහා ප්‍රදේශයේ සාමාන්‍ය මහජනතාවගේ සහය ලැබී තිබේ. පැරණි සිද්ධස්ථානවල පරිපාලනය කාලයත් සමග එක් පිරිසකින් තවත් පිරිසකට මාරු වී ඇත. මැතකදී සංවර්ධනය කරන ලද කුඩා සිද්ධස්ථාන ප්‍රධාන වශයෙන් නගරයේ සුළු ධනේශ්වර පිරිස විසින් ආරම්භ කරන ලද්දකි. විශේෂයෙන්ම එම ප්‍රදේශවල ත්‍රිරෝද රථ රියදුරන් විසිනි. මේ යටතේ විශේෂයෙන්ම ඉන්දියානු නිෂ්පාදිත ත්‍රිරෝද රථ මිලදී ගත් පුද්ගලයින් පාරිභෝගිකයෙකු ලැබෙන තුරු රැඳී සිටින ඇතැම් නම් කරන ලද භෞතික අවකාශයන් ඔවුන්ගේ උද්‍යාන ලෙස සලකයි. බලධාරීන් නගරයේ ඇතැම් කොටස් ත්‍රිරෝද රථ නැවතුම්පොළවල් ලෙස වෙන් කර ඇත; මෙම ත්‍රිරෝද රථ නැවතුම්පොළවල රියදුරන් පාරිභෝගිකයන් එනතුරු ත්‍රිරෝද රථ නවත්වා ඇති ස්ථානයන් ය. සමහර රියදුරන් හෝ ත්‍රිරෝද රථ හිමියන් එම ප්‍රදේශයේම පදිංචිකරුවන් වන අතර එසේත් නැතිනම් ඔවුන් සැලකිය යුතු කාලයක් එම ප්‍රදේශයේ සේවයට පැමිණි පිටස්තර පුද්ගලයන් වේ. මෙම අන්තර් සබඳතා පවත්වන ක්‍රියාවලියේදී බොහෝ ත්‍රිරෝද රථ රියදුරන් සභාපති, ලේකම්, භාණ්ඩාගාරික ආදී සම්මත වූ තනතුරු සහිත සංගම් පිහිටුවාගෙන ඇත. මෙම තනතුරු සඳහා ඔවුන්ගේ වාරය එන තෙක් බලා සිටීමට ඔවුන් පිළිගත හැකි යාන්ත්‍රණයක් ද සකස් කර ඇත. සමහර ත්‍රිරෝද රථ සංගම්, සංගමයේ දියුණුව සඳහා සාමාජික ගාස්තුව ලෙස දිනකට ත්‍රිරෝද රථයකින් රුපියල් 10ක ප්‍රමාණයක් එකතු කර ඇත. මෙම පර්යේෂණයට යොදා ගත් සිද්ධස්ථාන දහසයෙන් අටක් ත්‍රිරෝද රථ සංගම් මඟින් ඉදිකරන ලද අතර එයින් හතරක් ඔවුන් විසින් නඩත්තු කර කර පවත්වගෙන යනු ලැබේ.

## බෞද්ධ සිද්ධස්ථාන සංවර්ධනය ක්‍රියාවලියේදී බෝ ගසෙහි භූමිකාව

ඇතැම් සිද්ධස්ථාන සංවර්ධනය වී ඇත්තේ ඒ වන විටත් එහි තිබූ බෝ ගසක් පදනම් කර ගනිමිනි. මෙම අධ්‍යයන නියැදියට නියැදියට ඇතුළත් පූජනීය ස්ථාන හයකට වැඩි ගණනකට මෙම තත්ත්වය අදාළ වේ. සම්ප්‍රදායිකව බෞද්ධ හා හින්දු භක්තිකයන් බෝධීන් වහන්සේ වන්දනා කිරීමට

නැඹුරුවක් දක්වයි. පන්සලක බෞද්ධයන් වන්දනාමාන කරන වැදගත් වස්තූන් තුනක් තිබේ; ඒවා බුද්ධ ප්‍රතිමා, චෛත්‍ය සහ බෝධිය වේ. බෞද්ධයන් බෝ ගස හඳුන්වනු ලබන්නේ බෝධීන් වහන්සේ ලෙසය. බෞද්ධයන් බෝධීන් වහන්සේ වැඳපුදා ගැනීමට හේතු දෙකක් තිබේ. පළමු හේතුව බුදුන් වහන්සේ බුද්ධත්වය සාක්ෂාත් කර ගත්තේ එහි සෙවණේ වන නිසාවෙනි. ඉන් අනතුරුව බුදුරජාණන් වහන්සේ අනිමිස ලෝචන පූජාව සිදුකොට බුද්ධත්වයට පත්වීමට සෙවණ දුන් බෝධීන් වහන්සේට ගෞරව දැක්වූහ. දෙවන හේතුව නම් බුදුන් වහන්සේ විහාරස්ථානයේ නොමැති අවස්ථාවන්හී එහි පැමිණෙන සැදැහැවතුන්ට වන්දනාමාන කිරීම සඳහා දෙව්රම් වෙහෙර විහාර භූමියේ බෝ පැළයක් සිටුවන ලෙස බුදුරදුන් ආනන්ද හිමියන්ට අනුදැන වදාළේ බුදුන්වහන්සේගේ බණ ඇසීමේ අභිප්‍රායෙන් දෙව්රම් වෙහෙරට වැඩම කරන සැදැහැවතුන්  උන්වහන්සේ පන්සලේ නොසිටීම නිසා මහත් කලකිරීමකින් ආපසු යන බව ආනන්ද හිමියන් නිරීක්ෂණය කළ බැවිනි. බෝධි පූජා වත්පිළිවෙත බෞද්ධයන් අතර දීර්ඝ කලක සිට පවත්නා සම්ප්‍රදායකි. බෝධි පූජා පැවැත්වීම තුළින් ගිහි ජීවිතයට බෝධීන් වහන්සේ ගේ ආශිර්වාදය ලබා ගැනීම ඔවුහු අපේක්ෂා කරති. නිදසුනක් වශයෙන්, රෝගීන් සුවපත් කිරීම සඳහා , සුව පහසු දරු උපතක් සඳහා, විභාග සමත් වීම සඳහා, හොඳ රැකියාවක් ලබා ගැනීම සඳහා, අපල හා භූත දෝශයන්ගෙන් මිදීමට සහ උසාවි නඩු ජයග්‍රහණය කිරීමට යනාදිය සඳහා බෝධීන් වහන්සේ ගේ ආශිර්වාදය අපේක්ෂා කරති. බෝධි පූජාව පවත්වන විට බැතිමතුන් සුවඳ පැන් හෝ කිරි යොදා බෝධීන් වහන්සේගේ මුල් සෝදා, මල්මාලා පලන්දා, බෝධීන් වහන්සේගේ අතු මත කොඩි එල්ලා, කඳ මත සිවුරු ඔතා, පහන් දල්වා මල් පූජා කරති. සෙනෙවිරත්න (1980) දැක්වූ පරිදි මෙය  සමාජ තත්වය කුමක් වුවත් නාගරික මෙන්ම ග්‍රාමීය බෞද්ධයන් විසින් මනාව තහවුරු වූ සම්ප්‍රදායකි. බෝධි පූජාවන්හි ඉතිහාසය පිළිබඳ සලකා බලන විට එය මුලින්ම ආරම්භ කර ඇත්තේ ඉන්දියාව පාලනය කළ අශෝක රජුගේ පාලන සමයේදී ය. මීට අමතරව, පාර අසබඩ පිහිටි විශාල ගස් වන්දනාමාන කිරීම අවුරුදු ගණනාවක සිට පැවත එන පිළිවෙතකි. ඇතැම් විට මෙම පිළිවෙත ඉන්දියාවේ සිට ලංකාවට බුදුදහමේ ආගමනයත් ඒ සමඟ පැවති දේශීය ආගමික පිළිවෙත් හා

සම්ප්‍රදායන් සමග මිශ්‍ර වීම බෝ ගස් ආශ්‍රිත කොටගෙන සිද්ධස්ථානයන් ඉදිකිරීමට බලපා ඇත. සමහර සිද්ධස්ථාන අලුතින් පිහිටුවා ඇති අතර අලුතින් පිහිටුවන ලද සිද්ධස්ථාන බහුතරයක ද බෝධීන් වහන්සේලා රෝපණය කොට ඇත.

## නගරය, ආගම සහ මානව අරගලය

මෙම පර්යේෂණයට අනුව කොළඹ නගරයේ නාගරික ජනතාව වර්ධනය වෙමින් පවත්නා ආගමික අවකාශයක ජීවත් වීමට ලැදියාවක් දක්වන බව පෙනේ. මෙයට වෙනස්ව, බටහිර සමාජයේ නාගරික වැසියන් වඩ වඩාත් ලෞකික සමාජයක ජීවත් වීමට ප්‍රියතාවයක් දක්වයි. බටහිර නිර්වචන වලට අනුව නගරයක් යනු හොඳින් සැලසුම් කළ, මූලික යටිතල පහසුකම් නඩත්තුවේ සිට සංකීර්ණ මූල්‍ය ක්‍රියාකාරකම් දක්වා විහිදෙන මධ්‍යගත අධීක්ෂණ පද්ධතියකින් යුක්ත ලෞකික අවකාශයක් වේ. කොළඹ නගරවාසීන් තම ලෞකික ජීවිතය වැඩි දියුණු කර ගැනීම සඳහා සම්පත් එකතු කිරීමේ තරඟයක නියැලෙන අතර, ඉහළ අවධානමක් සහ අවධානමට භාජනය වීමට ඉහළ ප්‍රවණතාවයක් පවතින්නේ පුරෝකථනය (predictability) කිරීමේ හැකියාවක් සහිත පද්ධතීන්ගේ අඩුවක් පවතින බැවිනි. මල්ලිකාරච්චි (1998) මහනුවර නගරයේ සිංහල-බෞද්ධ වෙළෙන්දන් විසින් සිදුකරන ලද එදිනෙදා ආගමික චාරිත්‍ර අධ්‍යයනය කළ අතර එහිදී ආගමික හා ආර්ථික ක්‍රියාකාරකම් අතර පවත්නා සමීප සම්බන්ධතාවය ඉස්මතු කර වෙළඳාම සහ ආගමික චාරිත්‍ර අතර සහජීවනය විදහා දක්වයි. සංවර්ධිත රටවල් හා සසඳන විට රටේ සාමාන්‍ය මිනිසුන්ගේ ජීවන රටාවේ හැඩය තීරණය කරනු ලබන්නේ ක්‍රමානුකූලව වැඩිවන අපේක්ෂාවන් අභිලාෂයන් හෝ ආශාවන් සහ ඒවා සාක්ෂාත් කර ගැනීම සඳහා පවතින මාධ්‍යයන් අතර නොගැලපීම හේතුවෙන් බහුතරයක් ජනතාව ආතතියට පත්වීම හරහාය. අධ්‍යාපන ක්‍රමය, මාධ්‍ය, ගෝලීයකරණය සහ ලෝකයට පහසුවෙන් අවතීර්ණ විමේ මාර්ගයන්ගෙන් යුක්ත හෙයින් කොළඹ නගරයේ වෙසෙන මිනිසුන්ට අපේක්ෂාවන් රාශියක් ඇත. කෙසේ වෙතත්, මේ සඳහා පැහැදිලි මාධ්‍යයක් දැක ගැනීමට අපහසු ය. එවැනි සංදර්භයක් තුළ මිනිසුන් කුමන ආගමික වත්පිළිවෙත් අනුගමනය කරන්නේවූවද, කුමන ආගමික කණ්ඩායමකට අයත්වුවද, කාගේ හෝ මොනම

දේශනයක් වුවද වඩා "හාස්කම්" වලින් යුක්ත වේ නම්, උපතේ දී තමාට හිමි ආගම නොසලකා එය  අනුගමනය කිරීමට පෙළඹේ. මෙය කොළඹ  නගරය තුළ ආගමික සමමුහුර්තකරණය (religious syncretism) හැඩගැස්වීමට බලපෑවේ ය. ලෞකික අභිලාෂයන් සපුරාලීම සඳහා බෞද්ධයන් සහ සිංහලයන් තම තමන්ගේ ආගම් අදහන ආකාරය මෙම අධ්‍යයනයෙන් සාකච්ඡා කෙරේ.

ආගම යනු නිර්වචන තුළින් පැහැදිලි කරන දෙයකට වඩා අප මිනිසුන් ලෙස අත්දකින සජීවී මානව අත්දැකීමක කොටසකි. මානව විද්‍යාත්මක ප්‍රවේශයට අනුව "ආගම මිනිසුන් විසින් ඔවුන්ගේ සැබෑ සමාජීය වශයෙන් ව්‍යුහගත ජීවිත තුළ ක්‍රියාවට නංවන්නේ සහ උපයෝගී කර ගන්නේ කෙසේද" යන්න සොයා බැලීමට උනන්දුවක් දක්වයි (Eller 2007, 28). ආගම මිනිස් පැවැත්මේ කොටසකි. එමිල් ඩර්කයිම් (1858-1917) 1915 දී ප්‍රකාශයට පත් කරන ලද ඔහුගේ "The Elementary Forms of Religious Life" නම් කෘතියෙහි ශුද්ධ සහ ලෞකික ලෙස අගමෙහි මූලික කාර්යයන් දෙකක් විස්තර කරයි. ඩර්කයිම් ට අනුව ආගම යනු ඉහල සාමාජීයත්වයකින් යුක්ත දෙයක් වන අතර එම පිළිගැනීම සමාජ ඒකාබද්ධතාවය (social solidarity) සඳහා පදනමක් ලෙස ගත හැක. ආගම තුළින් සාමූහික සමාජ යථාර්ථය නියෝජනය කෙරේ. ආගම සමාජ පද්ධතියේ වැදගත් කොටසක් වන මිනිසුන්ගේ ජීවිතයට අර්ථයක් ලබා දෙයි. එය සමාජ සංශක්තිකභාවයේ (social cohesion) ස්වභාවය, ජීවිතයේ අරමුණ, සන්නිවේදනයේ සමාජ අවකාශය, අන්තර්ක්‍රියා, එක්රැස් කිරීම් සහ සමාජ සම්මතයන් යලි තහවුරු කිරීම් හැඩගස්වයි. ඉහත දක්වා ඇති ඩර්කයිම් ගේ න්‍යාය ඉතා සරල වුවද, රැඩ්ක්ලිෆ්-බ්‍රවුන්ගේ සිට මේරි ඩග්ලස් දක්වා අනෙකුත් මානව විද්‍යාඥයින් ආගම පිළිබඳ අධ්‍යයනයන්හි එය භාවිතා කර ඇත (Eller 2007, 148). සමස්ථයක් ලෙස, බුද්ධාගමේ ශුද්ධ වූ ජීවිතයට වැඩි අවධානයක් ලබා දෙන නමුත් වර්තමාන නාගරික සන්දර්භය තුළ වැඩි වැඩියෙන් මිනිසුන් පූජනීය අවශ්‍යතාවයන්ට වඩා ලෞකික ප්‍රතිලාභ කෙරෙහි වැඩි අවධානයක් යොමු කරන අතර එය මාතෘකාව තුළ අන්තර්ගත කිරීමට මා පෙළඹවූයේද එම නිසා ය. මෙයින් පෙන්නුම් කරන්නේ ලෞකික අවශ්‍යතාවයන් ආගමේ ශුද්ධ හෝ අධ්‍යාත්මික ලෙස හඳුන්වන දෑ මඟින්

ආදේශ වීමක් සිදු වී ඇති බවයි (Henslin 2004, 366-380). ඩුර්කයිම් ආගමෙහි ශුද්ධ සහ ලෞකික ස්වභාවයන් දෙක විස්තර කරනු ලබන්නේ " ශුද්ධ යනු විශේෂ, බලගතු, වෙනස් ක්ෂේත්‍රයකි - අප ස්පර්ශ කිරීමට හෝ නොසැලකිලිමත් ලෙස ළඟා කර ගැනීමට නොසිතන්නේ එනිසායි. ලෞකික යනු සාමන්‍ය, භෞතික, එදිනෙදා ක්ෂේත්‍රය ය- අප බොහෝ විට එහි වාසය කරන නමුත් එහි ස්පර්ශය මඟින් ශුද්ධත්වයට අගෞරවයක් හෝ අපවිත්‍ර වීමක් සිදු වේ" (Eller 2007, 21). අප රටෙහි පර්යේෂකයෙක් වූ ඩෙස්මන්ඩ් මල්ලිකාරච්චි ශ්‍රී ලංකාවේ කන්ද උඩරට අගනුවර වන මහනුවර නගරයේ දේශීය වෙළඳුන් පිළිබඳ අධ්‍යයනයේදී මෙම සංකල්ප දෙක භාවිතා කළේය. සුවඳ දුම් දැල්වීමේ චාරිත්‍රය හරහා පූජනීයත්වය සමග මුදල් කෙලින්ම සම්බන්ධ කරන අතර පහන් දැල්වීමේ චාරිත්‍රය සෞභාග්‍යය පිළිබඳ අදහස සමග සම්බන්ධ වී ඇත (1998, 149). මෙහිදී ඔහු වෙළඳාම (ජීවනෝපාය/ලෞකික ක්‍රියාකාරකම් mundane) සහ ආගම හෝ චාරිත්‍ර ශුද්ධ (Supramundane) අතර සම්බන්ධය යෝජනා කරයි.

ඔබේසේකර (1970) මිනිස් අවශ්‍යතාවයන්ගේ හෝ චේතනාවන්ගේ පීඩනය සැලකිල්ලට ගනිමින් හෝ සමාජ, ව්‍යුහාත්මක සහ ආර්ථික විචල්‍යයන් ක්‍රියාත්මක කිරීම හරහා ආගමික මූලධර්ම හා න්‍යායාත්මක ආගමික පරිවර්ථනය පිළිබඳව සාකච්ඡා කරයි. වර්තමානයේ ශීඝ්‍රයෙන් වෙනස් වන සමාජ ආර්ථික සන්දර්භය තුළ ජීවත් වන ජනතාවගේ වෙනස්වන අවශ්‍යතාවලට ප්‍රතිචාරයක් ලෙස බැතිමතුන්ගේ විවිධ අවශ්‍යතා සපුරාලීම සඳහා ථෙරවාදී බුදුදහමේ පරිවර්ථනය හඳුනාගත හැක. මැක්ස් වෙබර් න්‍යායමය බුදු දහම වෙනස් කිරීම පිළිබඳව සාකච්ඡා කර ඇත. ඔබේසේකර (1970) සිය "Religious Symbolism and Political Change in Ceylon" යන ලිපියේ දැවැන්ත සමාජ විපර්යාස, විශේෂයෙන්ම දේශපාලනික වෙනස්කම්වල ප්‍රතිඵලයක් ලෙස බුදුදහමේ ඇති වූ වෙනස්කම් පිළිබඳව සාකච්ඡා කරයි. ඔහු ප්‍රධාන වශයෙන් තම සාකච්ඡාව නාගරික සන්දර්භය තුළ සිදු කරයි . 1956 කාලය තුළ, ක්‍රිස්තියානි මධ්‍යම පන්තියේ දේශපාලන බලය අතුරුදහන් වී සිංහල කතා කරන බෞද්ධ ජනතාව වෙත බලය පැවරී තිබිණි. ඔහුගේ

සාකච්ඡාව පදනම් වී ඇත්තේ කොළඹ මාර්ග කිහිපයක් නැවත නම් කිරීම සහ කොළඹ නගරයේ වටරවුමේ සමහර බෞද්ධ ආචාර ධර්ම ප්‍රදර්ශනය කිරීම මතය. එය 1956 න් පසු දේශපාලන බලය සිංහල බෞද්ධයන් අතට මාරු වීමේ ප්‍රතිඵලයක් ලෙස සැලකේ. ඔබේසේකරයන් (1970) බුදුන් වහන්සේ විවිධ උත්සව අවස්ථාවන්ට අදාල කර ගැනීමේ ක්‍රියාවලිය හේතුන් තුනක් යටතේ සාකච්ඡා කළේය. 1) ශ්‍රී ලංකාව බෞද්ධ ජාතියක් ලෙස ප්‍රක්ෂේපණය කිරීම සඳහා, 2) දේශපාලන බලවේගයක් ලෙස බෞද්ධ භික්ෂූන් වහන්සේලාගේ ඉස්මතුවීම හොවා දැක්වීම සඳහා, 3) එය ස්වදේශික කටයුත්තක් ලෙස පෙන්නුම් කිරිම සඳහා වැනි මනෝවිද්‍යාත්මක හේතු දැක්විය හැක. ඔබේසේකර පෙන්වා දෙන්නේ නාගරික ප්‍රදේශවල වෙළෙදපොළවල් ආශ්‍රිතව බුද්ධ ප්‍රතිමා මගින් බුදුදහමත් සෙසු ලෝකය සමඟ සම්බන්ධතාවයත් විදහා දක්වා දේශපාලන බලය බෞද්ධයන් විසින් අත්පත් කර ගැනීම පෙන්නුම් කරන අතර නිවෙස්වල සිද්ධස්ථාන ඉදිකිරීමෙන් නාගරික බෞද්ධයන් තුළ ඇති වූ ආකල්පමය වෙනස පෙන්නුම් කරයි. අවසාන වශයෙන්, නගරයේ බෞද්ධ සංකේත පෙනුමෙන් යම් වෙනස්කම් පවතින බව ඔහු නිගමනය කළේය. මෙම වෙනස්කම් බුදුදහම ලෝකයට අවතීර්ණ වීම පෙන්නුම් කරන මාරුවීම සනිටුහන් කරයි; දේශපාලනික සහ සමාජීය අරමුණු මෙහෙයවමින් මෙම ලෞකික කාරණා කෙරෙහි ආගමේ භූමිකාව පෙන්නුම් කරයි; සහ අවසාන වශයෙන්, ආගමික ජීවිතය තාර්කීකරණය කිරීම  කුඩා සිද්ධස්ථානවල කාර්යයන් සැලකිල්ලට ගනිමින් විශ්ලේෂණ රාමුව සකස් කර ඇත. එමිල් ඩර්කයිම්, බ්‍රොනිස්ලොව් මැලිනොව්ස්කි, ඒ.ආර්. රැඩ්ක්ලිෆ්-බ්‍රවුන් විසින් සාකච්ඡා කරන ලද  සිද්ධස්ථාන ඉදිකිරීමේ සංසිද්ධිය විස්තර කිරීම සඳහා කෘත්‍යවාදී විශ්ලේෂණයක් භාවිතා කරන ලදී.

සිද්ධස්ථානවල එකතු කරන ලද වෘත්තාන්තයන්ට (narratives) අනුව මෙම සිද්ධස්ථානයන්හී ඉදිකිරීම් සහ නඩත්තු කිරීම් සම්බන්ධ නගරයේ අනුග්‍රාහකයින් සහ ගනුදෙනුකරුවන් ලෙස කණ්ඩායම් දෙකක සම්බන්ධතාවයක් පෙන්නුම් කෙරේ. අනුග්‍රාහකයන් මෙම සිද්ධස්ථානයන්හි ක්‍රියාකාරකම්වල ප්‍රධාන සංවිධායකයින්  වන අතර ඒවා  ප්‍රදේශයේ සමිති ලෙස

ද විග්‍රහ කළ හැක. මෙම සමිතීන් සමන්විත වන්නේ ප්‍රදේශයේ පදිංචිකරුවන්ගෙන් සමන්විත වූ මංසන්දි වල ත්‍රී රෝද රථ සංගම් වලින් ය. ප්‍රධාන සංවිධායකයින්ගෙන් සැලකිය යුතු ප්‍රතිශතයක් නගරයේ මහා පරිමාණ ව්‍යාපාරිකයන් මෙන්ම දෛනිකව අවශ්‍ය වන ද්‍රව්‍ය අලෙවි කරන ආපනශාලා සහ කුඩා අලෙවිසැල් පවත්වාගෙන යන කුඩා පරිමාණ ව්‍යවසායකයින්ගෙන් ද සමන්විත වේ. ඊට අමතරව මෙම ප්‍රදේශයන්හී දිගු කාලීනව වාසය කරන ජනතාව මෙම වත්පිළිවෙත් ආරක්ෂා කොට නඩත්තු කර ඉටු කරන ප්‍රධාන පුද්ගලයන් ලෙස කටයුතු කරයි. අසල්වාසීන්ගේ සහ අදාළ ප්‍රදේශවලට පැමිණෙන අමුත්තන්ගේ සහයෝගය සහ දායකත්වය සහිතව අනුග්‍රාහකයන් මෙම සිද්ධස්ථාන කුටීන් හී කටයුතු මෙහෙයවන ප්‍රධාන පුද්ගලයින් ය. සිද්ධස්ථාන කුටීන් වන්දනාමාන කිරීමට බොහෝ පුද්ගල කණ්ඩායම් සිටිති. ඔවුන්ගෙන් සමහරෙක් අසල්වැසි ප්‍රදේශවල පදිංචිකරුවන් වන අතර සමහරු කොළඹ සිට විවිධ නගරාශ්‍රිත ප්‍රදේශවල පදිංචිකරුවන් වන අතර අනෙක් අය දිනපතා කොළඹ නගරයට පැමිණෙන අය වෙති. විවිධ අවශ්‍යතා සඳහා දිනකට ලක්ෂ පහකට අධික පිරිසක් කොළඹ නගරය වෙත පැමිණෙති. මෙම දෛනික මගී ජනතාවගෙන් සැලකිය යුතු කොටසක් රාජ්‍ය හා පෞද්ගලික අංශයේ සේවකයන් වේ. රජයේ සහ පෞද්ගලික අංශයේ ප්‍රධාන කාර්යාල බොහොමයක්, විවිධ අමාත්‍යාංශ, හොඳම පෞද්ගලික සහ රජයේ රෝහල්, රාජ්‍ය හා පෞද්ගලික පාසල්, ගුවන් තොටුපළ සහ වරාය ඇතුළු පෞද්ගලික අංශ, විශාල යන්ත්‍ර සූත්‍ර මෙන්ම නිවෙස්වලට දෛනික අත්‍යවශ්‍ය ද්‍රව්‍ය අලෙවි කරන විශාල ව්‍යාපාරික ආයතන කොළඹ පිහිටා ඇති අතර ජනතාව මෙම ස්ථාන වෙත පැමිණ තම අවශ්‍යතා සම්පූර්ණ කර ගනිති. දෛනික ස්වීප් ටිකට් (daily sweep ticket) හෝ ලොතරැයි අලෙවි කරන්නන් වැනි කුඩා පරිමාණ ව්‍යාපාර කරන පුද්ගලයන් සහ කුඩා කඩ සාප්පු පවත්වාගෙන යන පුද්ගලයන් ද මෙම සිද්ධස්ථානවල අනුග්‍රාහකයන් වන අතර ප්‍රදේශයේ සාමාන්‍ය වැසියන් ද මෙම සිද්ධස්ථානයන් වන්දනාමාන කිරීමට පැමිණෙති. කෙසේ වෙතත්, අතිශයින්ම භක්තියෙන් වත්පිළිවෙත් කරන්නා වූ අනුග්‍රාහකයන් ලෙස සේවය කරන්නේ එම ප්‍රදේශයන්හී අසල්වැසියන්ය. වඩාත් සිතගන්නාසුළු කරුණ නම්, කොළඹ නගරයේ වෙනත් අර්ධ නාගරික ප්‍රදේශවල ජීවත් වන මිනිසුන් පවා

විවිධ සිද්ධස්ථානවල පවතින බෝධීන්ගේ විශේෂ හාස්කම් හේතුවෙන් ඒවාට බෝධි පූජා කොට වැඳපුදා ගැනීමට පැමිණිය හැක. වාර්තාවන්හි මැනවින් නිරූපණය වන ආකරයට භික්ෂූන් වහන්සේලා හෝ වෙනත් පුද්ගලයින් දොරටු පාලකයන් ලෙස නොමැති මෙම නිදහස් ආගමික අවකාශයන්හි අනුශාසකයෙකු වීමට වාර්ගිකත්වය හෝ ආගම කිසිසේත් වැදගත් නොවේ.

මෙම ලිපියේ ප්‍රධාන අවධානය යොමු කරන නගර වැසියන්ගේ ලෞකික කටයුතු සඳහා ආගම ලෞකිකකරණය කිරීමේ ක්‍රියාවලිය පුළුල් ක්ෂේත්‍ර තුනක් සම්බන්ධ කර සාකච්ඡා කෙරේ. එනම්, 1) ආරක්ෂාව හෝ රැකවරණය, 2) යහපැවැත්ම, සහ 3) මිනිසුන් තුළ අනන්‍යතාවය ගොඩනැගීම වේ. බුදුදහම ලෞකිකකරණය කිරීමේ ක්‍රියාවලිය නිරූපණය කරන මෙම ක්ෂේත්‍ර තුන වෙන වෙනම පහත සාකච්ඡා කෙරේ.

## මිනිසුන්ගේ ආරක්ෂාව සහතික කිරීම සඳහා කුඩා සිද්ධස්ථානයන්හි භූමිකාව

මෙහිදී, ආරක්ෂාව හා රැකවරණය පිළිබඳ සංකල්පය වඩාත් පුළුල් ලෙස සලකා බලනු ලබන්නේ දෘශ්‍යමාන මිනිසුන්ගෙන් මෙන්ම අදෘශ්‍යමාන නරක ආත්මයන්ගෙන් (evil spirits) පුද්ගලයා හා ඔහුගේ පවුලේ සාමාජිකයින්ට සහ සම්බන්ධිත කණ්ඩායම්වලට පවත්නා වූ තර්ජනයන් ද ඇතුලත් කිරීම සඳහා ය. තවද, මෙම අවස්ථාවේදී කතුවරයා අවධානය යොමු කරන්නේ ග්‍රහ වස්තූන්ගේ පිහිටීම හේතුවෙන් පුද්ගලයෙකුට ඇතිවිය හැකි අයහපත් ප්‍රතිඵල පිළිබඳවය. පොදුවේ ගත් කල, බහුතරයක් සිද්ධස්ථනයන්හී බෝධින් පවතින අතර බැතිමතුන් එහි බෝධි පූජා පැවැත්වීමට පුරුදු වී සිටී. පුද්ගල ජීවිතයට අපල හා අයහපත් බලපෑම් ඇති කරන කේන්ද්‍රවල ඇති නවග්‍රහ දෝෂ, එසේත් නැත්නම් ග්‍රහලෝක පිහිටීමේ පවතින දෝෂ නැති කර ගැනීමට මිනිසුන් මෙම චාරිත්‍ර සිදු කරයි. මෙම නවග්‍රහ දෝශ සූර්යයා, සඳු, බුධ, සිකුරු, අඟහරු, බ්‍රහස්පති, සෙනසුරු, රාහු සහ කේතු ලෙස ග්‍රහලෝක නවයක චලනයන් හා සම්බන්ධව පවතී. මිනිසුන්ට අපල කාලයන් පවතින විට, ඔවුන් විසින්ම හෝ ඥාතීන් විසින් බෝධි පූජාවන් චාරිත්‍ර සිදු කරනුයේ අදාළ පුද්ගලයා හදිසි අනතුරුවලට, ජීවනෝපායන් අහිමිවීමට හෝ පුද්ගලයාට

මෙන්ම පවුලේ අනෙක් සාමාජිකයන්ට මෙම ග්‍රහ චලනයන් නිසා සහ වෙනත් ඕනෑම හානිකර තත්ත්වයකට ගොදුරු වීම වැළැක්වීම සඳහා ය. නවග්‍රහ දසාවේ බලපෑම නිසා අපල කාලයන් ඇති අය තම කේන්දර කියවා මිනිසුන්ට සිදුවන අපල ගැන අනාවැකි  කියන සහ ඒවායෙන් වැළකී සිටීමට පියවරයන් නිර්දේශ කරන ජ්‍යෝතිෂ්‍ය ශාස්ත්‍රඥයන්ගේ උපදෙස් මත මේවා සිදු කිරීමට පෙළඹේ. ඔවුන් බෝධි පූජාව කරන අවස්ථාවේදී කියවීමට "සෙත් කවි" (ආශිර්වාද සඳහා ගායනා කරන කවි) නමින් නිශ්චිත කවි ලබා දෙයි. දරුණු රෝගාබාධ/අනෙකුත් නිදන්ගත රෝග, උසාවි නඩු හෝ සමාජයේ වෙනත් තර්ජනවලින් පෙළෙන තම දූ පුතුන් සහ අනෙකුත් ඥාතීන්ගේ ආරක්ෂාව අපේක්ෂාවෙන් පුද්ගලයන් මෙම සිද්ධස්ථානවලට පුද පූජා පවත්වන බව නිරීක්ෂණය විය. අනෙක් අතට, ජනතාවගේ විශේෂිත වු ගැටලු විසඳීම සඳහා මෙම සිද්ධස්ථානවලට පවතින ප්‍රසිද්ධිය සලකා බලා කිලෝමීටර් 20 ත් 30 ත් අතර දුර බැහැර ප්‍රදේශවල වෙසෙන අය ද මෙම සිද්ධස්ථානවලට පැමිණ බෝධි පූජා පවත්වා යහපැවැත්ම අපේක්ෂා කරයි. බොරැල්ල, පුංචි බොරැල්ල, රාජගිරිය සහ නාරාහේන්පිට පිහිටි සිද්ධස්ථාන වලට බැතිමතුන් අතර ඉතා ප්‍රසිද්ධත්වයක් පවතී. පුංචි බොරැල්ල පුදබිමේ කපු මහත්මයා සෙත් කවි වඩාත් බලගතු ආකාරයෙන් ජප කිරීම හේතුවෙන් ඉතා ජනප්‍රිය විය. මෙම ක්‍රියාවන් සතුරන්ගෙන් හා අනතුරුවලින් මෙන්ම පිළිකා වැනි නිදන්ගත රෝගවලින්ද ආරක්ෂාව ලබා දේ. පුංචි බොරැල්ල සිද්ධස්ථානයෙහි බැතිමතෙකු වන 55 හැවිරිදි කුසුමාවතී පවසන ආකාරයට මහ රෝහලට විශේෂයෙන්ම හෘද රෝග අංශයට යන බොහෝ රෝගීන් වෛද්‍ය ප්‍රතිකාරවලින් පසු යහපත් සෞඛ්‍යයක් අපේක්ෂාවෙන් සිද්ධස්ථානයේ බෝධි පූජා පවත්වන බව පැහැදිලි කළා ය. රාජගිරියේ පිහිටා ඇති බෝධියට රෝග සුව කිරීමේ බලයක් ඇතැයි විශ්වාස කරන බැවින් දුර බැහැර ප්‍රදේශවලින් ද මිනිසුන් පැමිණේ. බෝධි පූජා කොට පවුලේ යම් සාමාජිකයන් හට වඩා යහපත්  සෞඛ්‍යය තත්ත්වයන් අපේක්ෂාවෙන් බාරයක් වීමට බෝධියේ අතු මත එල්ලන ලද කුඩා කොඩි පර්යේෂක කණ්ඩායමට දැකගත හැකි විය. මෙම සිද්ධස්ථානයන් හි බුද්ධ ප්‍රතිමාවට අමතරව දේව ප්‍රතිමාවන් ද පවතින බව නිරීක්ෂණය විය.

ලීච් (1962) ශ්‍රී ලංකාවේ උතුරු මැද පළාතේ සිංහල-බෞද්ධයන් පිල්ලෙයාර් දෙවියන් නමස්කාර කිරීම ගැන සාකච්ඡා කරන විට හින්දු දේවස්ථානයන්හී දෙවියෙකු වන පිල්ලෙයාර් සහ බුදුන් වහන්සේ අතර සම්බන්ධතාවයක් ඇති බව ප්‍රකාශ කර ඇත. ගණ දෙවියන් සහ ඔහුගේ සහෝදර අයියනාර් යන දෙවිවරු බුදුරජාණන් වහන්සේගේ "යැපෙන්නන් වන අතර බුදුරජාණන් වහන්සේ උත්තරීතර වූ ශ්‍රමණයාණන් වේ" (Leach 1962, 83), එමඟින් බුදුදහමේ සමමුහුර්ත ස්වභාවය (syncretic nature) පෙන්නුම් කරයි. මෙම දෙවිවරුන් අතර නරක පුද්ගලයන්ගෙන් හොඳ මිනිසුන් ආරක්ෂා කරන මුරකාර දේවතාවුන් සිටින අතර හොඳ රැකියාවක් හෝ ජීවන සහකරුවෙකු සොයා ගැනීමට උපකාර කිරීමෙන් සමෘද්ධිය අත්කර ගැනීමට ආශිර්වාද කරන දෙවිවරු ද සිටිති. පොදුවේ ගත් කළ, දුප්පත්, ශිෂ්ට සම්පන්න මිනිසුන්ට එරෙහිව බොහෝ අසාධාරණයන් සිදුවන බව මිනිසුන් විශ්වාස කරන අතර බොහෝ දූෂිත ආයතන සමඟ ගනුදෙනු කිරීමට ඔවුන්ට සිදු වන බැවින් ඔවුන් හට යුක්තිය අපේක්ෂා කළ නොහැකි බව ඔවුන්ගේ මතය යි. ඒ සන්දර්භය තුළ ඔවුන් යුක්තිය පතා මෙම දෙවිවරුන්ගේ උපකාරය බලාපොරොත්තු වේ. පුංචි බොරැල්ල සිද්ධස්ථාන පරිශ්‍රය මධ්‍යයේ විශාල බුද්ධ ප්‍රතිමාව ද, එහි දෙපස කුඩා දේවතාවන්ගේ ප්‍රතිමාවන් ද පිහිටුවා තිබුණි. මේ අතර පත්තිනි, කාලි, ශ්‍රියා කන්තාව සහ සරස්වතී යන දෙවිවරුන් ද, නාථ, විභීෂණ, දැඩිමුණ්ඩ, කතරගම, විෂ්ණු, ගණ [පිල්ලෙයාර්], සමන් සහ සූනියම් වැනි දෙවිවරු ද වූහ. පුංචි බොරැල්ලේ කපු මහත්තයා ඉතා වෘත්තීයමය වශයෙන් "දේව පූජාව" [දෙවියන්ට පුද පූජා] සිදුකරන බවත්, පුද්ගලයාගේ ප්‍රශ්නය දෙසට දෙවියන්ගේ අවධානය දිනා ගැනීමේ බලයක් ඇති බවත් කුසුමාවතී පැහැදිලි කළාය.

මාර්ග අනතුරු, මාර්ග තදබදය සහ වෙනත් අපරාධ ක්‍රියාකාරකම් අවම කිරීමට එය දායක වන බව සිද්ධස්ථානවල බැතිමතුන් විශ්වාස කරයි. පිටකෝට්ටේ මංසන්දිය, ආනන්ද බාලිකා මාවත, නාරාහේන්පිට මංසන්දිය සහ ආනන්ද විද්‍යාලය ඉදිරිපිට ඉදිකර ඇති සිද්ධස්ථානය අසල ත්‍රිරෝද රථ රියදුරන් සමඟ කළ සාකච්ඡාවකදී මේ බව අවධාරණය විය. ප්‍රතිචාරකයන්ට අනුව

නාරාහේන්පිට හන්දියේ රිය අනතුරු විශාල ප්‍රමාණයක් සිදු වූ කාලයක් තිබූ අතර ඒවා බුදු මැදුර ඉදිකිරීමෙන් පසු අවම විය. මරදාන ආනන්ද විද්‍යාලය ඉදිරිපිට බුදු මැදුර ඉදිකරන ලද මංසන්දියෙහි බරපතළ රිය අනතුරු සිදු වූ අතර එයින් මරණ රැසක් සිදු වූ නමුත් එම සිද්ධස්ථානය ඉදිකිරීමෙන් පසු එම අනතුරු සැලකිය යුතු ලෙස අඩු වී ඇත.

ජාතික අර්බුදකාරී අවස්ථාවන්හිදී ද බෞද්ධ ජනතාව රටේ නායකයින්ට සහ ත්‍රිවිධ හමුදාවට ආශිර්වාද කිරීම සඳහා විහාරස්ථානවල මෙන්ම මෙම කුඩා සිද්ධස්ථානවල ද විවිධ පුද පූජා පවත්වති. මෙරට අභ්‍යන්තර යුද සමයේදී නාරාහේන්පිට, බොරැල්ල, රාජගිරිය යන ප්‍රදේශවල පිහිටි සිද්ධස්ථානයන්ට යුද බිමේ සිටින තම පවුලේ සාමාජිකයන්ට ආරක්ෂාව පතා සහ තුවාල ලැබූ සෙබළුන්ට සුවය ප්‍රාර්ථනා කරමින් විවිධ පුද පූජා පවත්වා ඇත. එල්.ටී.ටී.ඊ සංවිධානයට (දෙමළ ඊළාම් විමුක්ති කොටි සංවිධානය) එරෙහිව රටේ උතුරු හා නැගෙනහිර ප්‍රදේශවල සටන් වැදුණු සොල්දාදුවන්ට ආශිර්වාද කරමින් බැනරයන් මෙම සිද්ධස්ථානවල ප්‍රදර්ශනය කර තිබුණි. විජේරාම මංසන්ධියේ සංවිධායකයින් විසින් ශ්‍රී ලංකා හමුදා සෙබළුන්ට ආශිර්වාද කර බැනරයක් ප්‍රදර්ශනය කර ඇති බව නිරීක්ෂණය විය. ජාතික ආරක්ෂාව සම්බන්ධයෙන්ද මෙම සිද්ධස්ථානවල සංවිධායකවරුන් හට පවතින අදහස් සහ කැපවීම මෙයින් පෙන්නුම් කෙරේ.

ආගන්තුකයන් ලෙස නගරයට පැමිණෙන අය විවිධ හේතු නිසා මෙම සිද්ධස්ථානවල පිං කැට වලට මුදල් දමා වන්දනාමාන කරති. ඔවුන් කොළඹ නගරයේ රැඳී සිටින කාලය තුළ ආරක්ෂාව ලබාගැනීම සහ තම නිවෙස් වෙත ආරක්ෂිතව ආපසු යාම අපේක්ෂාවෙන් මෙම වන්දනාමානයන් සිදුකළා විය හැක.

ත්‍රිරෝද රථ සංගම් තමන් විසින් ඉදිකරන ලද බොහෝ සිද්ධස්ථානවල විවිධ පුද පූජා පවත්වමින් ආරක්ෂාව අපේක්ෂා කරති. මැටි පාර්ක් (Mati park) මංසන්දියේ එක් ත්‍රිරෝද රථ රියදුරෙක් (three wheel driver) 2009 දී මෙසේ පැවසීය. "අපි රෝද තුනක් උඩ දුවන නිසා සෑම විටම ඉහළ අවධානමක්

තිබෙනවා. අපගේ වෘත්තීය තුළ ඕනෑම දෙයක් සිදු විය හැකියි. අපි අපේ දෛනික වැඩකටයුතු පටන් ගන්න කලින් උදේම සිද්ධස්ථානය වැඳපුදාගන්නේ අපේ ආරක්ෂාව වගේම මගීන්ගේ ආරක්ෂාවත් බලාපොරොත්තුවෙන්. රෝමානු කතෝලිකයන් පවා ඔවුන්ගේ දවසේ වැඩ ආරම්භ කිරීමට පෙර සිද්ධස්ථානයට නමස්කාර කරනවා. මගියා මරාගෙන මැරෙන බෝම්බකරුවෙකුද අපරාධකරුවෙකුද යන්න දන්නේ කවුද? "(පුරුෂ, 50). එකල පෑලියගොඩ දී ත්‍රිරෝද රථයකින් යමින් සිටියදී අත්බෝම්බයක් සමඟ මරාගෙන මැරෙන කොටි සාමාජිකයකු අත්අඩංගුවට ගැනීමට පොලිසිය සමත් විය.මීට අමතරව සිද්ධස්ථානයන් අසල වාහන නවතා තැබූ ත්‍රිරෝද රථ රියැදුරන් සමඟ කළ සම්මුඛ සාකච්ඡාවලදීත් මෙයට සමාන අදහස් ප්‍රකාශිත විය. තව ත්‍රී රෝද රථ රියැදුරෙක් මාර්ග අනතුරකින් ගැලවුනු තම අත්දැකීම ප්‍රකාශ කළේය.

"අපි කුලියට ගමනක් ආරම්භ කරන සෑම විටම ආරක්ශාව අපේක්ශා කරමින් වඳිනවා. මම කිහිප වතාවක්ම අනතුරුවලට මුහුණ දුන්නා, නමුත් මම සුළු තුවාල වලින් බේරුණා. මේ සිද්ධස්ථානය මාව ආරක්ෂා කළා කියලා විශ්වාස කරන්න මට හේතු තියෙනවා" (පුරුෂ, 45)

ඊට සමානව, කොළඹ කුඩා කතෝලික සිද්ධස්ථානවල බැතිමතුන් ද මාර්ග අනතුරු අවම කිරීම සඳහා තම සිද්ධස්ථානවලට වැඳ පුදාගැනීමේ සුවිශේෂී බලපෑමක් ඇති බව අවධාරණය කළහ. ඔවුන්ට අනුව ඇතැම් සිද්ධස්ථාන හේතුවෙන් මාර්ග අනතුරු පමණක් නොව දුම්රිය අනතුරු වල ද අඩුවක් දැකගත හැක. වත්තල අල්විස් නගරයේ පිහිටි පූජනීය හදවතේ ප්‍රතිමාව ( ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ ගේ) සිද්ධස්ථානය (The statue of the Sacred Heart Shrine) පිහිටුවීමෙන් පසු එම ප්‍රදේශයේ මාර්ග අනතුරු විශාල ලෙස අඩු වී ඇති බව එම සිද්ධස්ථානය භාරව කටයුතු කළ වත්තල කතෝලික සංගමයේ කමිටු සාමාජිකයන් වන මාර්ටින් (67) සහ ජෝර්ජ් (47) සඳහන් කළහ. මෙම ප්‍රතිමාව කොළඹ මීගමුව ප්‍රධාන මාර්ගය හරහා මාර්ගයක් පිහිටා ඇති මංසන්ධියක පිහිටා ඇත. ගල්වල හන්දියේ පිහිටා ඇති ශාන්ත ජේම්ස් මුනිඳුන් වෙනුවෙන් කැප කර ඇති කුඩා සිද්ධස්ථානයට ද එවැනිම බලපෑම් ඇත. ශාන්ත අන්තෝනි සහ මරියා මවුතුමියට කැප කර බොරැල්ල

"බී" වත්තෙහි (කොළඹ නගරයේ වෙසෙන නාගරික මුඩුක්කු සහ පැල්පත් ප්‍රජාවන් වැඩි වශයෙන් මෙම නමින් හඳුන්වයි) කුඩා සිද්ධස්ථාන පිහිටවීම හේතුවෙන් ප්‍රදේශයේ සිදුවන දුම්රිය අනතුරු සංඛ්‍යාව අඩු වී ඇත. 47 හැවිරිදි දෙමළ කතෝලිකයෙකු වන බොන්ඩ් පවසන පරිදි, ශාන්ත අන්තෝනි මුනිඳුන්ගේ සහ මරියා මවුතුමියගේ ප්‍රතිමා සහිත සිද්ධස්ථාන ස්ථාපිත කිරීමෙන් බොරැල්ල බී වත්තෙහි ජීවත් වන සාමාජිකයින් දුම්රිය අනතුරු වලින් ආරක්ෂා වී ඇත. තවද, දුම්රිය අනතුරු හේතුවෙන් මිය ගිය පුද්ගලයන් අශුද්ධාත්මයන් හෝ අවතාර බවට පත්වන බවත්, රාත්‍රියේදී මෙම අවතාර රේල් පාරෙහි ඇවිද යන අයුරු දුටු පුද්ගලයන්ට විවිධ මානසික රෝග හටගන්නා බවත් මෙම පිරිස විශ්වාස කළහ.

## මිනිසුන්ගේ යහපැවැත්ම සහතික කිරීම සඳහා සිද්ධස්ථානයන්හි දායකත්වය

බර්ක්විට්ස් පුරෝකථනය කළ පරිදි, "ආර්ථික හා සංස්කෘතික ගෝලීයකරණයේ බලපෑම් සමකාලීන ශ්‍රී ලාංකේය බුදු දහමට විශාල ලෙස බලපානු ඇතැයි අපට අපේක්ෂා කළ හැක" (Berkwitz 2003, 70). පවතින ආර්ථික පීඩනය සහ ගෝලීය පරිභෝජනවාදය (Global Mass consumerism) බෞද්ධ ආගමික වත්පිළිවෙත් වෙනස් කර ඇති බව වර්තමාන පර්යේෂණවලින් පෙන්නුම් කරයි. යහපැවැත්ම යටතේ කෙරෙන සාකච්ඡාව පුද්ගලික, විස්තෘත පවුල්, පවුලේ මිතුරන්, ප්‍රජාව සහ රටේ සමස්ත ජනතාවට අදාල වන සේ සැලකිය හැක. දරුවන්ගේ ජීවිතවල දියුණුව, තම ව්‍යාපාරයේ දියුණුව, විභාග සමත්වීම, සාර්ථක විවාහ ජීවිතය යනාදිය අපේක්ෂාවෙන් මිනිසුන් බෝධි පූජා සිදු කරයි. ජනතාවගේ විවිධ ප්‍රශ්නවලට උපකාර කිරීමේ බලයක් සිද්ධස්ථානයන්ට සහ විශේෂයෙන්ම බෝ ගසට තිබේද යන්න පිළිබඳවවන දර්ශකයක් ලෙස බෝ ගසෙහි ප්‍රමාණය ඔවුන් සලකයි.

වත්තේගෙදර හන්දියේ පිහිටි සිද්ධස්ථානයෙහි නඩත්තු කටයුතු සිදු කර ඇත්තේ ප්‍රදේශයේ ඔරේන්ජ් නමැති සමාගමක් විසින් බව මෙහිදී සටහන් විය. ඔවුන් වසරකට වරක් එහි තීන්ත ගල්වා වර්ණවත් කර ප්‍රතිසංස්කරණය කරති. ක්ෂේත්‍ර චාරිකාවේ නියැලෙන අතරතුර එම ආයතනයේ සේවකයන්

දෙදෙනකු නිල ඇඳුමින් සැරසී සිද්ධස්ථානය ප්‍රතිසංස්කරණය කරමින් සිටින අයුරු අපට නිරීක්ෂණය විය. සමාගමේ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය හෝ සමාගමේ නායකත්වය වසරක් පාසා මෙම ප්‍රතිසංස්කරණය දිගටම සිදු කිරීමට හේතු වන්නේ දෙවියන්ගේ ආශිර්වාදය හෝ වෙනත් අද්භූත බලයක් පිළිබඳ විශ්වාසයක් විය හැකිය. පුංචි බොරැල්ල පුදබිමට නිතර යන එන 55 හැවිරිදි කුසුමාවතී මහත්මිය සඳහන් කළේ තම කාර්යාලයන්ට හෝ සේවා ස්ථානයන්ට යන බොහෝ පුද්ගලයන් එම සිද්ධස්ථානයෙහි පිං කැටයට යම් මුදලක් දමා තමන් කරන කුමන කටයුත්තකට හෝ හොඳ ප්‍රතිඵලයක් අපේක්ෂාවෙන් වන්දනාමාන කරයි. 50 හැවිරිදි වැදගත් ව්‍යාපාරිකයෙකු වන සිරිසෝම පවසා සිටියේ කොළඹ ජාතික රෝහලේ නේවාසික රෝගීන්ගේ ඥාතීන් මෙන්ම ගැබිණි මව්වරුන්ද පුංචි බොරැල්ල බෝධියට පැමිණෙන බවයි.

සාමාන්‍යයෙන්, මෙම සිද්ධස්ථානවලට වන්දනාමාන කරන පුද්ගලයන් විශ්වාස කරන්නේ ඔවුන්ට සිද්ධස්ථානවලට (හෝ සිද්ධස්ථාන වල පවතිනවා යැයි විශ්වාස කෙරෙන අද්භූත බලවේගයන්ගෙන්) ඔවුන් විසින් සිදු කරනු ලබන වත්පිළිවෙත් හේතුවෙන් පිහිටක් (උදව් / රැකවරණය/ආශිර්වාදය) ඇති බවයි. සියලුම සිද්ධස්ථානවල පාහේ සම්මුඛ සාකච්ඡාවන්ට සහභාගී වූ පුද්ගලයන් තමන්ට එම සිද්ධස්ථානයන්ගෙන් පිහිටක් ලැබෙන බව හෙළිදරව් කළ ද වැඩිදුර තොරතුරු හෙළි කිරීමට ඔවුහු මැලි වූහ. මෙම අකමැත්ත සඳහා බලපෑ හේතූන් රාශියක් ඇතත් පොදුවේ ගත් කළ අද්භූත බලවේග සමඟ ඇති සම්බන්ධය අද්විතීය සම්බන්ධයක් (unique connection) යැයි විශ්වාස කරන බැවින් ඒවා හෙළිදරව් කිරීම හෝ ප්‍රසිද්ධියේ සාකච්ඡා නොකළ යුතු බවට විශ්වාසයක් පවතී. රත්තනපිටිය පුදබිමේ විවිධ පුද පූජා පැවැත්වූ පුද්ගලයෙක් හට රුපියල් ලක්ෂ 10ක ලොතරැයියක් හිමි වූ බව එම පුදබිම පිහිටුවීමේ ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කළ සුමනරත්න මහතා පවසයි. සිද්ධස්ථානය ඉදිකිරීමෙන් පසු දිගින් දිගටම දේවාලයේ විදුලි පහන් දැල්වීම සහ නිවා දැමීමේ කාර්යය මෙම පුද්ගලයා භාරයේ තිබී ඇත. ඔහු එම ස්ථානය වෙනුවෙන් කළ යහපත් සේවය වෙනුවෙන් ඔහුට මෙම ත්‍යාගය ලැබුණු බව ප්‍රදේශයේ ජනතාව විශ්වාස කරති.

ත්‍රිරෝද රථ රියැදුරන්ගේ සංගම් සම්බන්ධ වූ සියලුම සිද්ධස්ථානවල පාහේ රියැදුරන් බහුතරයක් උදෑසන රාජකාරි ආරම්භ කිරීමට පෙර එම කුඩා සිද්ධස්ථානවලට තම සංවර්ධනය, ආරක්ෂාව හා රැකවරණය පතා මල් පූජා කර හෝ තෙල් පහන් දල්වා හෝ වෙනත් පුද පූජා පවත්වමින් වන්දනා කරති. මැටි පාර්ක් සිද්ධස්ථානයේ (Mati Park shrine) බැතිමතුන් තනි තනිව ද විවිධ චාරිත්‍ර ඉටු කරයි. රබර්වත්ත පාර මංසන්දියෙහි කුඩා බුදු මැදුරක් ඉදිකිරීමට මුල් වූ කුමාර තමාට ලැබුණු ආශිර්වාදයන් ගැන මෙසේ ප්‍රකාශ කරයි: "මම දරුවන් හය දෙනෙකුගේ පියෙක්. අපට ඇති ආදායම සීමිතයි. මට මෙතන කුඩා සිද්ධස්ථානයක් හදන්න ඕන වෙලා මම ඒක කළා. ඒක හැදුවට පස්සේ මට ත්‍රීවීල් දෙකක් ගන්න පුළුවන් වුණා, ලැබෙන ආදායමෙන් මම සෑහීමකට පත් වෙනවා. මට මෙයින් ආශීර්වාදයක් ඇති බව විශ්වාස කිරීමට මට හේතු තියනවා" (පුරුෂ, 40).

රාජගිරිය පුදබිම වන්දනාමාන කරන 65 හැවිරිදි ගුණසේකර මහත්මිය සඳහන් කළේ මෙම සිද්ධස්ථානයෙන් තම පවුලට ආශිර්වාදයන් ලැබී ඇති බවයි. 1986 දී සිය සැමියාගේ අභාවයෙන් පසු ඇය තම පුතුන් දෙදෙනා සහ දියණිය තනිවම ඇති දැඩි කර ඇත. දැන් ඇගේ එක් පුතෙක් ජපානයේ ජීවත් වන අතර අනෙකා ලන්ඩන් නගරයෙහි ජීවත් වේ. ඇයගේ එකම දියණිය රාජගිරියේ පදිංචිව සිටින අතර රාජගිරියේ එක්සත් ජාතික පක්ෂ (එ.ජා.ප) සංවිධායකවරියක් ලෙස කටයුතු කරයි. 1970 දී බෝධීන් වහන්සේ වැඳපුදා ගැනීමට පටන් ගත් දා සිට ඇයට එහි ආශිර්වාදය ලද බව විශ්වාස කිරීමට හේතු තිබුණි. තවද, එහි පවතින ජනප්‍රියත්වය සහ හාස්කම් බලය පෙන්නුම් කරමින් දිනපතා විශාල පිරිසක් එම සිද්ධස්ථානයට පැමිණෙන බවද ඇය වාර්තා කළාය. දේශපාලන ප්‍රශ්නවලට මුහුණ දීම එම පුදබිම තමන්ට උපකාර කළ ආකාරය ඇය තවදුරටත් පැහැදිලි කළාය.

"අපි එක්සත් ජාතික පක්ෂ පාක්ෂිකයින් විදියට මුල ඉඳලම ගොඩක් දුක් වින්දා. අපිට තිබුණු තර්ජන ගැන සාකච්ඡා කරන්නවත් බෙදාගන්නවත් කවුරුත් හිටියේ නැහැ. අපි ඒ දවස් වල එක දිගට අඬනවා. දේශපාලන තර්ජන සහ බිය ගැන්වීම්වලින් මිදෙන්නට අද්භූත බලවේගවල පිහිට පතා බෝධිය ළඟ

පැය ගණන් හඬා වැළපුණු අවස්ථාද තිබුණා. අද වැඩිපුරම අපට හිරිහැර කළ අය ජීවතුන් අතර නෑ; ඔවුන් දඬුවම් වින්දේ මම සිද්ධස්ථානයේ බොහෝ වන්දනාමාන කළ නිසායි" (කාන්තා, 40).

පත්වීම් භාර ගැනීමට පෙර මැතිවරණයට තරඟ කිරීමට අයදුම්පතක් ඉදිරිපත් කිරීමේදී; සහ සම්මුඛ පරීක්ෂණ ආදියට මුහුණ දීමට පෙර මිනිසුන් සිද්ධස්ථානයට පැමිණෙන බව රාජගිරියේ බෝධි ආරක්ෂක සමිතියේ සභාපති ජීවානන්ද පවසයි. කෝට්ටේ මහනගර සභාවේ නගරාධිපතිවරයා මැතිවරණයට නාමයෝජනා භාරදීමට පෙර මෙම සිද්ධස්ථානය වැඳ පුදාගත් ආකාරය පිළිබඳව ඔහු සඳහන් කළේය. කුසුමාවතී පුංචි බොරැල්ල පුදබිමේදී කළ බාරයෙන් තම බලාපොරොත්තු ඉටු වූ අයුරු පැහැදිලි කළාය. ඇගේ පුතා සහ දුව ද ආශීර්වාද ලැබූහඃ

"ඉස්සර මම හැමදාම මේ සිද්ධස්ථානයට ගියත් දැන් අසනීප නිසා එහෙම කරන්න බැහැ. ඒත් මම හැම මාසෙම මහ රෝහලේ සායනයට එන හැම අවස්ථාවකම මේ සිද්ධස්ථානයට යනවා.මම මෙතනට බාර තුනක් කළා. මගේ පුතාට රස්සාවක් ලැබිලා දුවට බබාලා දෙන්නෙක් ලැබුනා, අපිට මෙතන භාර වෙලා අපේ වාහනය විකුණගන්න පුළුවන් වුණා. ඒ නිසා මේ සිද්ධස්ථානයෙන් අපිට පිහිට (ආශිර්වාද) ගොඩක් තියෙනවා කියලා මම විශ්වාස කරනවා" (කාන්තා, 55).

ඔවුන් තම වාහනය විකුණා ගැනීමට බොහෝ වෙහෙස මහන්සි වී ඇතත්, ඔවුන් පූජා භූමියේ භාරයක් වූ පසු, වාහනය හොඳ මිලකට විකිණීමට හැකිව ඇත. ඇය පවසන පරිදි, සිද්ධස්ථානවල භාරයක් වූ පසු මත්ද්‍රව්‍ය භාවිතා කිරීමේ පුරුද්ද අත්හැර දැමූ සමහර මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වූවන් ද සිටියහ. ඇය තම දරුවන්ට තම විභාග සමත් වීමට භාර වී එය සාර්ථක වූයේ මෙම මැදුරෙන් ලැබුණු ආශිර්වාදය හේතුවෙන් ය. මිනිසුන්ගේ මෙම අත්දැකීම් සරලව ඉවත දැමිය නොහැකි අතර, මෙතුළින් පෙනී යන්නේ මෙම සිද්ධස්ථානයන්හී වන්දනාමාන කොට පිහිට අපේක්ෂා කරන මිනිසුන්ගේ ඕනෑ එපාකම් සහ අවශ්‍යතාවල අතිශය සංකීර්ණ ස්වභාවයයි.

මෙම සිද්ධස්ථානවලට පැමිණෙන විවිධ බැතිමතුන් පිළිබඳව අපගේ අවධානය යොමු කළ විට අපට කණ්ඩායම් කිහිපයක් හඳුනාගත හැකිය. ඇඟලුම් කම්හල්වල හෝ වෙනත් ආයතනවල සේවය කිරීමට ගමෙන් නගරයට පැමිණි තරුණ පිරිස් ද ආරක්ෂාව සහ යහපැවැත්ම අපේක්ෂාවෙන් මෙම සිද්ධස්ථාන වෙත පැමිණෙති. දිනපතා කාර්යාලවලට හෝ සේවා ස්ථානවලට යන විට මෙම සිද්ධස්ථාන පසුකර යන අවට නිවෙස් හිමියන් නගරය තුල සිටිනා කාළය තුළ ඔවුන්ට යහපැවැත්ම සහ ආරක්ෂාව අපේක්ෂා කොට මෙම පොදු ස්ථානවලට නොගොස් මුදල් කැටයට දමා භාරයක් කර නිශ්ශබ්දව වන්දනාමාන කරති.

මෙම කුඩා සිද්ධස්ථාන මගින් ප්‍රදේශයේ ජනතාව සහ සමාන ක්‍රියාකාරකම් කරන පුද්ගලයන් අතර එකමුතුකමක් ගොඩනැගී ඇත. උදාහරණයක් ලෙස මැටි පාර්ක් (Mati Park) හන්දියේ කතෝලික ත්‍රිරෝද රථ රියදුරන් පවා වැඩ ආරම්භ කිරීමට පෙර බෞද්ධ සිද්ධස්ථානය වැඳ පුදා ගනී. ත්‍රිරෝද රථ රියදුරන් කවුරුන් හෝ වේවා වෙනත් අයකු මෙම චාරිත්‍ර ඉටු කරන තෙක් බලා නොසිට බුදු මැදුර පිරිසිදු කර තෙල් පහන දල්වා ගැනීමට කාලය සොයා ගනී. ඇතැම් විට ප්‍රතිමා ඉදි කර ඇත්තේ මත් ද්‍රව්‍යවලට ඇබ්බැහිවීම, සුරාපානය වැනි අයහපත් දේ ඉවත් කරන යහපත්, සාමකාමී වාතාවරණයක් ඇති කිරීමේ අරමුණින් ය. එය හේතු කොටගෙන සංවිධායකයින්ට අවශ්‍ය වූයේ සමාජීය වශයෙන් නොපිළිගත් හැසිරීම් වල යෙදෙන තරුණ තරුණියන් වෙනස් කිරීමේ අපේක්ෂාවෙන් සෑම තැනකම ප්‍රතිමා ඉදිකිරීමටයි.

ප්‍රජාවගේ යහපැවැත්ම සම්බන්ධයෙන් බෞද්ධ සිද්ධස්ථානවල විටින් විට කෙරෙන වැඩසටහන් රාශියක් පිළිබඳව අපට සාකච්ඡා කළ හැක. වෙසක් සහ පොසොන් උත්සවයන් හී දී දන්සැල් පැවැත්වීම, බෞද්ධ උත්සවවලදී තොරණ් සකස් කිරීම සහ සිද්ධස්තානයන් හා ඒ අවට වර්ණ බල්බ සහ කොඩිවලින් අලංකාර කිරීම, සෑම පුර පසළොස්වක පොහොය දිනයකම බණ දේශනා (බුදුරජාණන් වහන්සේගේ ධර්මය) සංවිධානය කිරීම ආදිය මෙම සිද්ධස්ථාන රැක බලා ගන්නා කණ්ඩායම් විසින් සංවිධානය කරනු ලබන පොදු කටයුතු කිහිපයකි. දීර්ඝ කාලයක් තිස්සේ පැවත එන සිද්ධස්ථානයන්ට විවිධ

හේතුන් මත පැමිණි බැතිමතුන්ගෙන් විශාල මුදලක් එකතු වී ඇති බැවින් ප්‍රජා සේවය කිරීමට වඩා හොඳ මූල්‍යමය හැකියාවක් ඇත. පුංචි බොරැල්ල සිද්ධස්ථානය භාර කමිටු සාමාජික සිරිසෝම අනාවරණ කළ පරිදි 2009 වසරේ තමන් කමිටු සාමාජිකයෙකු ලෙස සිටි කාලයේ සිද්ධස්ථානයේ කැටයෙන් එකතු වූ මුදලින් මසකට රුපියල් 500 බැගින් දුප්පත් පවුල්වල සිසුන් 20 දෙනෙකුට සහ වයෝවෘද්ධ පුද්ගලයන් 20 දෙනෙක්ට ද ලබාදීමේ වැඩසටහනක් ආරම්භ කළ බවයි. විශේෂයෙන් 2009 බෝම්බ පිපිරීම් ආදී විවිධාකාර වූ ත්‍රස්තවාදී ප්‍රහාරවලදී ජාතික අවශ්‍යතාවයක් ලෙස යුද බිමේ තුවාල ලැබූ සොල්දාදුවන්ට හා සිවිල් තුවාල ලැබූවන්ට ප්‍රතිකාර කිරීමට රෝහල් සූදානම්ව තැබීමට ලේ අවශ්‍ය වූ විට, වනාත පුදබිම අවට ජනතාව එකතු වී ලේ දන්දීමේ කඳවුරු සංවිධානය කළහ.

නාරාහේන්පිට පුදබිම පදනම් කරගත් බෝධිරාජ සමිතිය මගින් වෛද්‍ය සායන සංවිධානය කිරීම, ඇස් කණ්නාඩි බෙදාදීම, මධ්‍යසාර භාවිතයට සහ දුම්පානයට එරෙහිව ව්‍යාපාර පැවැත්වීම සිදුකරයි. එම සේවාවන් තවත් වර්ධනය කරමින් ගව ඝාතකාගාරයේ සිටින මස් සඳහා වෙළඳාමට සිටින ගවයින් නිදහස් කිරීමට සංවිධායකයින් සෑම වසරකම පියවර ගෙන ඇත. මෙම ගවයින් ප්‍රදේශයේ ගොවීන් වෙත භාරදීම සිදුකෙරෙන අතර එමගින් ඇතැම් පවුල්වල ආදායම ද ඉහළ නැංවේ. සංවිධායකයින් විවිධ මාතෘකා යටතේ විවිධ දේශන මහජනතාව සඳහා පවත්වයි. වෛද්‍ය විද්‍යාව සහ බුද්ධාගම මැයෙන් පවත්වන ලද එක් දේශනයකට 70 දෙනෙකු පමණ සහභාගී විය. ඔවුන් සැලකිය යුතු අධ්‍යාපනික ජයග්‍රහණ පෙන්වන අවශ්‍යතා සහිත දරුවන්ට ශිෂ්‍යත්ව ද ප්‍රදානය කරති (එනම් පහ ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගය සමත් වීම). තවද බෝධිරාජ සමිතිය ඔවුන්ගේ සේවය වැඩිදියුණු කිරීම සඳහා ඉන්දියාවේ මහාබෝධි සමාගම සමඟ සමීප සම්බන්ධයක් ඇති කර ගැනීමට උත්සාහ කරයි. තවද, ඔවුන් "සිංහල බෞද්ධයා" නම් බෞද්ධ පුවත්පත ඔවුන්ගේ සාමාජිකයන් අතර බෙදාහරින ලදි. එම සංගමයේ ලේකම්වරයා සඳහන් කළේ පාසල් මගින් සංවිධානය කරන ලද ආගමික කටයුතු සඳහා ද ඔවුන් අනුග්‍රහය දක්වන බවයි.

එලෙසම කතෝලික සිද්ධස්ථානවල සංවිධායක කමිටු සහ අනුශාසකවරුන්ද සමාජ සේවා සහ සුබසාධන කටයුතු රාශියක නිරත වෙති. වේළුවන පාරේ සාමාජිකයින් 50 දෙනෙකුගෙන් සමන්විත ශාන්ත අන්තෝනි සමිතිය එම දේවස්ථානයට අදාළ කටයුතු වල නිරත වෙන අවස්ථාවන්හීදී බොහෝ ප්‍රජා සේවයන් ඉටු කළ බව දක්නට ලැබේ. එම ප්‍රජා සේවාවන් අතර මූල්‍ය ගැටලු ඇති කිතුනු භක්තිකයන්ගේ නිවාස ප්‍රතිසංස්කරණය කිරීමට උපකාර කිරීම, ඔවුන්ගේ අවමංගල්‍ය කටයුතු සඳහා උපකාර කිරීම, සිද්ධස්ථානයේ දානයන් දීම, ලේ දන්දීම, සහ වැඩිහිටි නිවාස සඳහා උපකාර කිරීම ඉතා වැදගත් වේ. ඇලකන්ද සිද්ධස්ථානයේ සංවිධායක කමිටුව මගින් ද එවැනිම සුබසාධන කටයුතු සිදු කරන ලදී. වත්තල පූජනීය හදවතේ ප්‍රතිමාව (ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ ගේ) (The statue of the Sacred Heart Shrine) ඉදිකළ වත්තල කතෝලික සංගමය විසින් සෑම වසරකම පෙබරවාරි 13 වැනි දින එම සිද්ධස්ථානයේ පැවැත්වෙන උත්සවයකදී දිළිඳු පවුල් නියෝජනය කරන සිසුන් 200කට පමණ පාසල් නිල ඇඳුම් පරිත්‍යාග කිරීම සිදුකරන ලදී.

## අනන්‍යතා ගොඩනැගීමේ ක්‍රියාවලියේ කොටසක් ලෙස සිද්ධස්ථානයන් ගොඩනැගීම

සමස්තයක් ලෙස ගත් කල, සිද්ධස්ථාන ඉදිකිරීමේ සමස්ත ක්‍රියාවලියම අනන්‍යතා ගොඩනැගීමේ ප්‍රයත්නයක් ලෙස සැලකිය හැකිය. මෙම අනන්‍යතාවයට මූලික වශයෙන් ආකාර දෙකක් ඇතː 1) පුද්ගලික හෝ පුද්ගල අනන්‍යතාවය සහ 2) කණ්ඩායම් හෝ ප්‍රජා අනන්‍යතාවය (ආගමික, වාර්ගික, සදාචාරාත්මක, ආදිය). ප්‍රථමයෙන් පුද්ගල අනන්‍යතාවය ගැන පැහැදිලි කරමි. පුද්ගල අනන්‍යතාවය පිළිබඳ සාකච්ඡාවේ දී සිද්ධස්ථානයන් ඉදිකිරීමට හෝ විවිධ පුද පූජා පැවැත්වීමට නායකත්වය ගන්නා පිරිස් උත්සාහ කරනුයේ තමන් "හොඳ මිනිසුන්" ලෙස බාහිර ලෝකයට ප්‍රක්ෂේපණය කිරීමට ය. ඔවුන්ට ඔවුන්ගේ "යහපත් සදාචාරාත්මක හැසිරීම" මහජනතාවට ප්‍රදර්ශනය කිරීමේ අවශ්‍යතාවයක් ඔවුන් සතුව ඇත. මෙම අනන්‍යතා ප්‍රක්ෂේපණය ඔවුන්ට ඉතා ප්‍රයෝජනවත් වන සමාජ අවස්ථාවන් (social niche) නිර්මාණය කරයි. බුදු මැදුරක් ස්ථාපිත කළ එවැනි අනුග්‍රාහකයෙකු වෙත ත්‍රිරෝද රථ රියදුරන් පිරිසක්

තුළ පැවැති අදහස් මෙවැනි තත්ත්වයකට සාක්ෂි විය. ඔවුන්ට අනුව බුදු මැඳුර ඉදිකිරීමට සහ එහි නඩත්තුව සඳහා මූලිකත්වය ගත් ව්‍යාපාරිකයා සත්‍ය වශයෙන්ම එකතු වූ මුදල් අවභාවිතා කරන බොරුකාරයෙකි. ඔහු සෑම විටම බලයේ සිටින දේශපාලන පක්ෂය සමඟ ගනුදෙනු කළ අතර සැබවින්ම දූෂිත පුද්ගලයෙක් විය. ඔහුගේ නීති විරෝධී මත්පැන් අලෙවිය සහ මෙවැනි ආගමික කටයුතුවල නියැලීම අතර සමාන්තරයක් දැකීමට ඔවුන්ට අපහසු විය. ඔවුන් ව්‍යාපාරිකයා "හොඳ" දේවල නිරත වූ බව උපකල්පනය කරන්නේ හොර අරක්කු අලෙවි කිරීමේ ව්‍යාපාරය සහ ඔහුගේ දූෂිත ස්වභාවය වසන් කිරීමට දරන උත්සාහයක් වශයෙනි.

ආරම්භයේ දක්වා ඇති පරිදි කණ්ඩායම් අනන්‍යතා බොහෝ ආකාරයන් පවතී. මෙම සිද්ධස්ථාන ඉදිකිරීම් බොහොමයක් ප්‍රදේශයේ ආගමික අනන්‍යතාවය ස්ථාපිත කිරීමේ හෝ තහවුරු කිරීමේ කොටසක් ලෙස සැලකිය හැකිය. පුංචි බොරැල්ල සහ බොරැල්ල සිද්ධස්ථානයන් පිහිටුවීමේ මුල් අවධියේදීම මෙය පැහැදිලිව පෙනෙන්නට තිබුණි. සෝම හාමුදුරුවන්ගේ නායකත්වයෙන් එකල ආගමික ප්‍රබෝධයක් ඇති වූ අතර බෞද්ධයන් නගා සිටුවීමේ දේශපාලන ව්‍යාපාරය ලෙස ජාතික හෙළ උරුමය පක්ෂය සෝම හාමුදුරුවන්ගේ අපවත් වීමෙන් පසුවද බෞද්ධයන් කිතුනුවන් මෙන්ම මුස්ලිම්වරුන් බවට පත්කිරීමේ ක්‍රියාවන්ට එරෙහිව ආගමික අනන්‍යතාවය ගොඩනැගීම සඳහා විශාල කාර්යභාරයක් ඉටු කළහ. සෝම හිමි ජීවමානව සිටියදී උන්වහන්සේ දේවත්වය පිළිබඳ සංකල්පයට එරෙහිව ඉදිරිපත් කළ තර්ක කිතුනුවන්ට සහ මුස්ලිම්වරුන්ට තර්ජනයක් වූ අතර උන්වහන්සේගේ හදිසි අපවත්වීම රටේ බෞද්ධ ජනතාවගේ සිත් තුළ විශාල සැකයක් ඇති කළේය. තම අනන්‍යතාවය තහවුරු කිරීමේ මාර්ගයක් වශයෙන් කොළඹ නගරයේ බෞද්ධ සිද්ධස්ථාන ගොඩනැගීමට ද මෙම තත්ත්වය බලපා ඇත. සෝම හාමුදුරුවන්ගේ ගුණ සමරුව සඳහා වාර්ෂිකව සාංඝික දානමය පිංකමක් සංවිධානය කරමින් සැමරුමට විජේරාම හන්දියේ පිහිටි සිද්ධස්ථාන සංවිධායකයන් කටයුතු කර ඇත.

ත්‍රිරෝද රථ රියදුරන් "යහපත් කණ්ඩායමක්" ලෙස ප්‍රක්ෂේපණය කිරීමට දරන උත්සාහය ද මෙම අනන්‍යතා ගොඩනැගීමේ එක් අංගයකි. අද සාමාන්‍යයෙන් ගත් කළ ත්‍රිරෝද රථ රියදුරන් තුළ කපටි, කෛරාටික , බොරුකාර, අශෝභනවත් බව වැනි නුසුදුසු ගුණාංග පවතින බවට විශ්වාස කරන නිසාත්, විශේෂයෙන් ඔවුන් අවදානම් සහගත රියැදුරන් ලෙස සමාජය දකින නිසාත් ඔවුන් කෙරෙහි විශ්වාසය නැති වී ඇත. එබැවින් මෙම තත්ත්වය විනීත රියදුරන් හට අනෙක් අයට වඩා වැඩි සේවාලාභීන් ලබා ගැනීමට හැකි වූ අතර පුද්ගලයින් අතර ඉල්ලුමක් ඇති විය. එහෙයින් ත්‍රිරෝද රථ රියදුරන් සිද්ධස්ථාන ඉදිකිරීම වැනි ක්‍රියාවන් සිදු කරන, අනුන්ගේ මානව හිමිකම්වලට ගරු කරන "විනීත මිනිසුන්" ලෙස ප්‍රක්ෂේපණය කිරීමට උත්සාහයක් දැරීම මෙයට හේතු විය.

ධර්මපාල චින්තනය ප්‍රචලිත කිරීමේ අරමුණින් බ්‍රිතාන්‍ය රජයෙන් රට නිදහස් කර ගැනීමට සටන් කළ බෞද්ධ පුනරුදවාදියෙකු (Buddhist revivalist) වූ අනගාරික ධර්මපාලතුමා අනුස්මරණය කිරීම සඳහා නාරාහේන්පිට පුදබිම පදනම් කරගත් බෝධිරාජ සමිතිය සෑම වසරකම උත්සවයක් සංවිධානය කරයි. සංවිධායකයින් විසින් සිද්ධස්ථානය ඉදිරිපිට ධර්මපාලතුමාගේ ප්‍රතිමාවක් ඉදිකර ඇත්තේ බුදුමැදුරට අයත් වූ භෞතික අවකාශය පුළුල් කරමිනි. රාජ්‍ය අනුග්‍රහය සහිතව පැවති උත්සවයකදී ප්‍රතිමාව විවෘත කරන ලද්දේ ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස එවකට අගවිනිසුරුවරයා වූ සරත් එන් සිල්වා මහතා ගේ සහභාගීත්වයෙනි. එම බුදු මැදුර ඉදිකිරීම රටේ බෞද්ධ අනන්‍යතාවය තහවුරු කිරීමේ ක්‍රියාවලියක් ලෙස සැලකිය හැකිය. මල්ලිකාරච්චි (1998) මහනුවර සිංහල-බෞද්ධ වෙළෙන්දන් අතර පවතින ජාතිකවාදී හැඟීම් පිළිබඳව ද පැහැදිලි කළේය. ප්‍රදේශයේ ප්‍රබල ව්‍යාපාරිකයකු වන සිරිසෝම මහතා ඔහුගේ අදහස් මෙසේ දැක්වීය.

"අපි බෞද්ධ රටක්; එය වටිනා මැණිකක් (It is a precious stone). පොදු ස්ථානවල පූජනීය ස්ථාන ඉදිකිරීමෙන් හානියක් නෑ, ඒත් එය දිගටම රැකබලා ගැනීමේ වගකීම අපට තියනවා. අපට එයින් මිදිය නොහැකියි. බුදුමැදුරක්

ස්ථාපිත කිරීමට අවශ්‍ය නම්, එසේ කරන්න, නමුත් එහි චාරිත්‍ර ඉටු කිරීම නොසලකා හැරිය යුතු නැත " (පුරුෂ, 60)

පූජනීය ස්ථානවල සංවර්ධනය වෙනුවෙන් කටයුතු කළ වැදගත් පුද්ගලයන් සියලු දෙනා මෙම මතවාදය දැරූහ. මෙය බෞද්ධ රටක් බැවින් එය ආරක්ෂා කර පවත්වාගෙන යාම අපගේ යුතුකම බව ඔවුහු විශ්වාස කළහ. පූජනීය ස්ථානවල සංවිධායකයින් මෙන්ම බැතිමතුන් ද අයිතිය පදනම් කරගත් ප්‍රවේශයක් දරයි. ඊට වෙනස්ව, එම පර්යේෂණයේ අනෙක් කොටස වූ ක්‍රිස්තියානි, හින්දු සිද්ධස්ථාන පිළිබඳව , ජනවාර්ගික / ආගමික පක්ෂ පදනම් දේශපාලනය විශ්ලේෂණය කිරීමේදී ඉහත සඳහන් ප්‍රකාශය සඳහා සුළු වෙනස්කමක් පෙන්නුම් කරයි. කෙසේ වෙතත්, කතෝලික ප්‍රදේශවල විවිධ සාන්තුවරයන්ගේ, කුරුසයේ සහ ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ සිද්ධස්ථාන ඉදිකරමින් ක්‍රිස්තියානි ආධිපත්‍යය ස්ථාපිත කිරීමේ ප්‍රවණතාවක් මතුවෙමින් තිබේ. එපමණක් නොව, හින්දු භක්තිකයන් ද කොළඹ ඔවුන්ට අදාල ප්‍රජාවන්හි විවිධ දෙවි දේවතාවුන්ට කැප වූ කුඩා හින්දු සිද්ධස්ථාන නිර්මාණය කර ඇත.

## නිගමනය

අවසාන වශයෙන්, මෙය 'බෞද්ධ ක්‍රමයට ජීවත්වීම' ලෙස අර්ථ දැක්විය හැකිය: නගරයේ එදිනෙදා අරගලයන් සහ සම්බන්ධ වෙමින් වෙනස් වන සමාජ, දේශපාලන-ආර්ථික අවකාශය මධ්‍යයේ බුදුරජාණන් වහන්සේගේ ඉගැන්වීම්වලට අනුකූලව සදාචාරාත්මකව හා යුක්ති සහගත ලෙස ඔහු/ඇය ජීවත් වීම. නොපැහැදිලි ක්‍රමවේදයන්ගෙන් යුත් ජයග්‍රහණ වලින් හැඩගැසුණු ඉතා තරඟකාරී ලෝකයක, විවිධ ද්‍රව්‍යමය අපේක්ෂාවන් සහ සුවපහසු ජීවිතයක් සාක්ෂාත් කර ගැනීම සඳහා මිනිසුන් එක්රැස් වූ නගරයක, ඔවුන් තම ආගම්වලින් වැඩි ප්‍රතිලාභ ලබා ගැනීමට නැඹුරු වෙති. මෙම පසුබිම පොදුවේ සියලුම ආගමික කණ්ඩායම් සඳහා ආගමික අවකාශයක ජීවත් වීමට වැඩි ඉල්ලුමක් නිර්මාණය කර ඇති අතර, මෙම පර්යේෂණය කොළඹ නගරයේ බෞද්ධයන් මුහුන දෙන ගැටළු වල ස්වභාවය හොඳ දක්වයි. මෙම පර්යේෂණයේ විග්‍රහයෙන් යෝජනා වූයේ බෞද්ධ සිද්ධස්ථාන වන්දනා කිරීමේදී දැකගත හැකි ලෝකෝත්තර (ශුද්ධ) අරමුණු වලට වඩා ලෞකික

ප්‍රතිලාභ සඳහා මාධ්‍යයක් ලෙස ථේරවාදී බෞද්ධ මතවාදය භාවිතා කරන්නේ ඇයි සහ කෙසේද යන්නයි. එය බුදුදහමේ ලෞකිකකරණය (secularization of Buddhism) ලෙස හඳුනාගත හැකි වේ. 2009 සහ 2019 දී එකතු කරන ලද මානවවංශලේඛික දත්ත සංසන්දනය කිරීමේදී මෙහි වර්ධනයක් ඇති බව පෙනේ. නුදුරු අනාගතයේදී මෙම රටාව වෙනස් වන බවට පැහැදිලි ඇඟවීමක් ද නොමැත. එබැවින්, නව ආගමික ප්‍රවණතා, පුද්ගලයන්ගේ සහ කණ්ඩායම්වල තමන්ට අනන්‍ය වූ අත්දැකීම් සහ විශ්වීය බලවේග සහ ආගම පිළිබඳ පැහැදිලි කිරීම් සහ ඔවුන්ගේ සමාජ ජීවන ලෝකයට ඒවායේ බලපෑම පිළිබඳ වැඩිදුර ගවේෂණය කිරීම සිත්ගන්නා කරුණකි.

## මූලාශ්‍ර

Berkwitz, C. S. (2003). “Recent Trends in Sri Lankan Buddhism.”*Religion* 33, 57-71.

Carter, J. R. (1979). *Religiousness in Sri Lanka*. Colombo: Marga Institute.

Eller, J. D. (2007). *Introducing Anthropology of Religion*. New York: Routledge.

Gombrich, R. and Gananath, O. (1990). *Buddhism Transformed: Religious Change in Sri Lanka*. Princeton: Princeton University Press City: Publisher.

Gombrich, F. R. (2006). *Theravāda Budd hism: A Social History from Ancient Benares to Modern Colombo.* Oxon: Routledge.

Henslin, J. M. (2004). *Essentials of Sociology: A Down-to-Earth Approach*. Pearson: New York.

Leach, E. R. (1962). “Pulleyar and the Lord Buddha: An Aspect of Religious Syncretism in Ceylon.” *Psychoanalysis and the Psychoanalytic Review* 49 (2), 81-102.

Mallikarachchi, D. (1998). “The Scrambling of the Sacred and the Profane by the Contemporary Sinhalese Buddhist Traders in the City of Kandy, Sri Lanka: A Case Study.” *Sri Lanka Journal of Social Sciences* 21 (1&2), 135-166.

Obeyesekere, G. (1963). “The Great Tradition and the Little in the Perspective of Sinhalese Buddhism.” *The Journal of Asian Studies* 22 (2),

139-153. Available at: <http://www.jstor.org/stable/2050008> (accessed August 2020).

Obeyesekere, G. (1970). “Religious Symbolism and Political Change in Ceylon.” *A Journal of Social Sciences* 1 (1), 43-63. Obeyesekere, G. (1977). “Social Change and the Deities: Rise of the Kataragama Cult in Modern Sri Lanka.” *The Man* 12 (3/4), 377-396. Available at: <http://www.jstor.org/stable/2800544> (accessed August 2020).

Piyarathne, A. (2017) “Collective Ritual as a Way of Transcending Ethno-religious Divide: The Case of Kataragama Pāda Yātrā, in Sri Lanka.” *Sri Lanka Journal of Social Sciences* 40 (1), 41-52. Available at: <http://doi.org/10.4038/sljss.v40i1.7500> (accessed August 2020).

Piyarathne, A. (2018). *Constructing Commongrounds: Everyday Lifeworlds Beyond Politicized Ethnicities in Sri Lanka*. Nugegoda (Colombo): Sarasavi Publishers.

Seneviratne, H. L. (1980). “Bodhipuja: Collective Representations of Sri Lanka Youth.” *American Ethnologist* 7 (4), 734-743. Available at: <http://www.jstor.org/stable /643479> (accessed August 2020).

Stirrat R. L. (1979). “The Shrine of St Sebastian at Mirisgama: An Aspect of the Cult of the Saints in Catholic Sri Lanka.” *The Man* 16 (2), 183-200. Available at: <http://www.jstor.org/stable/2801394> (accessed August 2020).

*The Official Website of the Colombo Municipal Council*. Available at: <https://www.colombo.mc.gov.lk/colombo.php> (accessed July2020).